# THE WHITE HACKLE

# වයිට් හැකල්

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව | Journal of the Sri Lanka Light Infantry



**ASSUMED DUTIES AS THE**

## COLONEL OF THE REGIMENT SRI LANKA LIGHT INFANTRY

**"There is nothing more practical than a good theory"**

**101** ISSUE | **JULY 2019 SEPTEMBER**

www.army.lk/lightinfantry
editor.whitehackle@gmail.com

# EDITORS



**CENTRE COMMANDANT**
Col DAK Dissanayake WWV RWP RSP



**COLONEL OF THE REGIMENT**
Maj Gen LM Mudalige RWP RSP ndu



**DEPUTY CENTRE COMMANDANT**
Lt Col JKRP Jayasinghe RWP RSP USP SLLI



**ADJUTANT RHQ SLLI**
Maj HGS Priyantha RWP RSP psc SLLI



**OFFICER IN CHARGE**
**WHITE HACKLE PUBLICATION**
Maj PLA Wickramasinghe SLLI

**CHIEF CONSULTANT** Maj Gen LM Mudalige RWP RSP ndu

**EDITOR IN CHIEF** Col DAK Dissanayake WWV RWP RSP

**ASSISTANT EDITORS** Lt Col JKRP Jayasinghe RWP RSP USP SLLI
Maj HGS Priyantha RWP RSP psc SLLI
Maj PLA Wickramasinghe SLLI
Lt PGD Sandakelum SLLI (White Hackle Publication)

**HONORARY CONSULTANTS** Gen RMD Ratnayake (Rtd) WWV RWP RSP VSV USP ndu psc
Maj Gen WDLP Wickramasinghe (Rtd) RSP KSV

**COMPUTER TYPE SETTING & DESIGNING** L/Cpl Suranga RBP - White Hackle Publication

**PHOTOGRAPHERS** Cpl Pathmasiri UDN - White Hackle Publication
L/Cpl Iranga HADS - White Hackle Publication

**DISTRIBUTION** WO II Anura Bandara P - White Hackle Publication
L/C Herath HMIR - White Hackle Publication



# කතෘ වැකිය

ශ්‍රී ලංකා පාබල හමුදාවේ හඬ අභිමානවත්ව විධාරණය කරමින් නොනවතින දිගු ගමනක් යන ශ්‍රී ලංකා පාබල හමුදා වයිට් හැකල් සඟරාව මේ වන විට අති සාර්ථක 101 වන කලාපය ට අවතීර්ණ වී ඇත. මේ වන විට විවිද බාධක කම් කටොළු මධ්‍යයේ මෙතෙක් අප ආ ගමන් මගේ තවත් ඉදිරියට යා යුතු මග බොහෝ ය. වයිට් හැකල් සගරාව මෙලෙස ඉදිරියට යන ගමන්මගේ ශක්තිමත් අඩිතාලම සපයන්නේ පාඨක ඔබ විසින් අප වෙත එවනු ලබන නිර්මාණාත්මක ලිපි මගින් බැව් පසක් කරමි.

මෙම සගරාව පිළබඳව හා සගරාවේ පලකරනු ලබන ලිපි නිර්මාණ පිළිබඳව ඔබගේ අදහස් හා විවේචන අප වෙත එවීමෙන් මෙම සඟරාවේ අඩුපාඩු සකසා ගනිමින් ශක්තිමත්ව ඉදිරියට යාමට අපට අත්වැලක් වනු නොඅනුමානය. වයිට් හැකල් සගරාව යුද හමුදාවේ නිර්මාණාත්මකම සගරාවයි. එය කළඑලි බසින්නේ ඉපැරණි ඉතිහාසයකට උරුමකම් කියනු ලබන ශ්‍රී ලංකා පාබල මැණියන්ගේ සෙවනින් වීම අපගේ අභිමානයයි.

ඔබගේ සියලු නිර්මාණාත්මක ලිපි ලේඛන, සිතුවම්, නිසදැස් හා හාස්‍ය උත්පාදක වැකි ආදිය අප වෙත හැකි සෑම විටම ලබාදීම වයිට් හැකල් සගරාවට ඔබ විසින් ලබාදෙනු ලබන මහත් සහයෝගයයි. අප සමග ඉදිරියට යාමට කෙරෙන සහෝදර ආරාධනාවක් ලෙසින් ඔබ වෙත මෙම ලිපිය ලියා තබමි.

(ප්‍රධාන කතෘ)

## READERS PLEASE WRITE IN

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 101st issue. This Journal is Published for members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans. We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of "THE WHITE HACKLE" depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhala, Tamil and English). What is value is, making the attempt, and then we can surely do our best. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through " THE WHITE HACKLE ", the journal of the oldest and proudest Regiment n the Sri Lanka Army. If you have much to say about your Battalion's experience, go ahead and write into " THE WHITE HACKLE " we are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen. Our Motto is " Ich Dien", " I Serve". Let " THE WHITE HACKLE " be a way to serve each other, our Regiment and our country with our flag flying high as it always will. Wishing you all the very best.

-Editor-





## PRINTING & PUBLISHING

**Regiment Centre**
**Sri Lanka Light Infantry**

Telephone - 0112855204 / 0112855357 - 59
Ext - 57656 Fax- 0112855204
E-mail -editor.whitehackle@gmail.com
Website - www.army.lk/lightinfantry

# මෙවර කලාපයෙන්

## රෙම ශ්‍රීලපාහ
## Regiment Centre


| | |
|---|---|
| රෙම ශ්‍රීලපාහ  නව රෙජිමේන්තු අධිපති | 03 |
| ආරක්‍ෂක ලේකම් තුමන්ගේ ශ්‍රීලපාහ සංචාරය | 06 |
| යුද හමුදාවෙන් විශ්‍රාම යන හිටපු රෙජි අධිපති තුමන් | 07 |
| යුද හමුදාවෙන් විශ්‍රාම යන ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ  නිලධාරීන් | 10 |
| නව රෙජිමේන්තු අධිපති තුමන්ගේ ප්‍රථම ඒකක සංචාරය | 14 |
| රෙජිමේන්තු අධිපති තුමන්ගේ රෙම ශ්‍රීලපාහ ඒකක සංචාර | 15 |
| යුද හමුදාවේ  ඉහළ තනතුරු දරණ ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිධාරීන් | 16 |
| සුබ මොහොතින් නව තනතුරු | 17 |


## සේවා වනිතා සංගමය
## Ladies Club SLLI


| | |
|---|---|
| ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාවේ නව සභාපතිතුමිය | 18 |
| පනාගොඩ විරුකැකුළු පෙරපාසල් සංචාරය | 19 |
| සේවා වනිතා නිවාසාධාර | 20 |


## බළඇණි
## Battalions


| | |
|---|---|
| 1 ශ්‍රීලපාහ පුවත් | 21 |
| 5 (සෙවි) ශ්‍රීලපාහ පුවත් | 22 |
| 6 ශ්‍රීලපාහ පුවත් | 23 |
| 7 ශ්‍රීලපාහ පුවත් | 24 |
| 8 ශ්‍රීලපාහ පුවත් | 25 |
| 9 (සෙවි) ශ්‍රීලපාහ පුවත් | 26 |
| 11 ශ්‍රීලපාහ පුවත් | 27 |
| 12 ශ්‍රීලපාහ පුවත් | 28 |
| 14 (සෙවි) ශ්‍රීලපාහ පුවත් | 29 |
| 16 (සෙවි) ශ්‍රීලපාහ පුවත් | 30 |


## විශේෂාංග
## Feature


| | |
|---|---|
| ශ්‍රීලපාහ රණවිරු දස්කම් | 31 |
| සිතක සේයා | 32 |
| උපන්දින සුබ පැතුම් | 33 |
| කෙටි කථාව | 34 |
| වතුර බොන්න එපා | 36 |
| සමාව දීම | 37 |
| WHY IS READING IMPORTANT | 38 |
| මාසික පාළන පරීක්ෂාව | 39 |
| හිනාවෙන්න එකතුවෙන්න | 40 |
| TOP FOCUS | 41 |


# TOP FIVE



නව ආරක්‍ෂක ලේකම් තුමන්ගේ රෙම ශ්‍රීලපාහ සංචාරය Page 06



රෙම ශ්‍රීලපාහ
නව රෙජිමේන්තු අධිපති Page 03



නව රෙජි අධිපති තුමන්ගේ
ප්‍රථම ඒකක සංචාරය Page 14



ශ්‍රීලපාහ සේවා වනිතා
ශාඛාවේ නව සභාපති Page 16



යුද හමුදාවෙන් විශ්‍රාම යන
හිටපු රෙජිමේන්තු අධිපති Page 07




## කවරයේ කථාව

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති තුමන් ලෙසින් අභිනවයෙන් රාජකාරි භාරගනු ලැබූ මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සමීප ඡායාරූපයකින් මෙවර 101 වයිට් හැකල් සඟරාවේ මුල් කවරය වර්ණවත් කර ඇත.

# ශ්‍රී ලංකා පාබල හමුදාවේ නව රෙජිමේන්තු අධිපති

## මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු



**අභිනවයෙන් පත් වූ 10 වැනි රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් 2019.07.11 දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ වැඩ භාරගන්නා ලදී.**



රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණි නව රෙජිමේන්තු අධිපති තුමන් ප්‍රධාන දොරටුව අභියසදී රෙජිමේන්තු නියෝජ්‍ය සේනාවිධායක ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෝෂ්ඨ නිලධාරී තුමන් විසින් ගෞරවපූර්වකව පිළිගන්නා ලද අතර කඳවුරු සම්මාන මුරයක් ලබා දීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ඩීජ්කේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් එතුමන් සරඹ භූමිය වෙත කැඳවාගෙන යන ලදී. එහිදී නව රෙජිමේන්තු අධිපති තුමන් වෙත යුද හමුදා සම්ප්‍රදායානුකූලව වර්ණ ධජ සහිත ඉතා අභිමානවත් සම්මාන පෙළපාලියක් පුදකරන ලදී.

ඉන් පසු පාබල හමුදා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වා දේශයේ උන්නතිය වෙනුවෙන් තම ජීවිතය පුදකරන ලද අභීත රණවිරුවන් වෙනුවෙන් තම කෘතවේදිත්වය පිරිනමන ලදී. තවද මෙම අවස්ථාවට පැමිණ සිටි සියලුම නිලධාරීන්, බළලත් නිලධාරීන් හා ජේෂකොනොනින් සමඟ සමූහ ජයාරූපයකට ද පෙනීසිටින ලදී. පසුව අභිනවයෙන් පත්වූ රෙජිමේන්තු අධිපති තුමන් තම කාර්යාලයේදී සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දල්වා ආගමික වතාවත් මැද තම ධූරයේ රාජකාරී භාරගන්නා ලද අතර මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් බනි සැර නිවස්නයේදී බළලත් නිලධාරීන් සහ ජේෂකොනොනීන් සමඟ තේ පැන් සංග්‍රහයකට ද එක්විය.

ඉන්පසු හධ පිරිස් අමතමින් හරවත් දේශනයක් සිදුකර, රටට ස්ථිර සාමය උදාකිරීම උදෙසා දායකත්වය ලබාදුන් මියගිය, ආබාධිත හා සේවයේ සිටින සියලුම නිලධාරීන් හා සෙසුනිලයින් හට ප්‍රණාමය පුද කරන ලද අතර, රෙජිමේන්තුවක් ලෙස අනාගතයේදී මුහුණ දීමට තිබෙන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දී ජයග්‍රහණය කරා යාමට සියලු නිලධාරීන් සහ සෙසුනිලයින් හට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රර්ථනා කරන ලදී. තවද 2019.07.10 වන දින මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් අරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) අඟදාපති ලෙස ද රාජකාරී භාරගන්නා ලදී.

















# ආරක්ෂක අමාත්‍යංශයේ නව ආරක්ෂක ලේකම්

ජෙනරාල්
එස්එච්එස් කෝට්ටේගොඩ (විශ්‍රාමික)
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පි ආර්එස්පි
විඑස්වී යුඑස්පි එන්ඩීසි

ආරක්ෂක අමාත්‍යංශයේ නව ආරක්ෂක ලේකම් ලෙස පත්වූ ජෙනරාල් එස්එච්එස් කෝට්ටේගොඩ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පි ආර්එස්පි විඑස්වී යුඑස්පි එන්ඩීසි (විශ්‍රාමික) ජ්‍යෂ්ඨ නිලධාරී තුමන් ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියනු ලබන මෙම රෙජිමේන්තුවට අයත් ජ්‍යෂ්ඨ නිලධාරියෙකි. හිටපු යුධ හමුදාපතිවරයෙකු මෙන්ම රෙජිමේන්තු අධිපති ලෙසද කටයුතු කල මෙම ජ්‍යෂ්ඨ නිලධාරී තුමන් ශ්‍රී ලංකා පාබල හමුදාවටත් යුධ හමුදාවටත් සමස්ථ දේශයටත් වසර 35කට වඩා අග්‍රගණ්‍ය සේවාවක් සිදුකල ජ්‍යෂ්ඨ නිලධාරිවරයෙකි. 2019.05.29 දින අරක්ෂක අමාත්‍යංශ ලේකම් ලෙස වැඩ භාරගත් මෙතුමන් 2019.07.27 දින තම මව් රෙජිමේන්තුවේ සංචාරයක නිරත විය



රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණි මෙම නිලධාරි තුමන් වෙත ප්‍රධාන දොරටුව අභියසදී මුරහල පසු කර යෑමක් සිදුකිරීමෙන් පසු රෙජිමේන්තු අධිපති තුමන් විසින් එතුමන් සරඹ භූමිය අසලදී පිළිගෙන ආචාර පිඨිකාව වෙත කැඳවාගෙන යන ලද අතර, එහිදි යුද හමුදා සම්ප්‍රදායානුකූලව වර්ණ ධජ සහිත ඉතා අභිමානවත් සම්මාන පෙළපාලියක් පුදකරන ලදී. ඉන් පසු පාබල හමුදා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වා දේශයේ නිදහස වෙනුවෙන් තම ජීවිතය පුද කරන ලද අභීත රණවිරුවන් වෙනුවෙන් තම කෘතවේදිත්වය පිරිනමන ලදී.

මෙම අවස්ථාවට පැමිණි සිටි සියලුම නිලධාරින් සමග සමූහ ජායාරූපයකට පෙනීසිටි ආරක්ෂක ලේකම් තුමන් බනිසැර නිවස්නයේදී බළලත් නිලධාරින් සහ ජ්‍යෙකොනොනින් සමඟ තේ පැන් සංග්‍රහයකට ද එක් වන ලදී.

තවද ඉන් අනතුරුව සන්ධ්‍යා කාලයේදි රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරි නිවස්නයේදි ආරක්ෂක ලේකම් ජෙනරාල් එස්එච්එස් කෝට්ටේගොඩ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පි එන්ඩීසී (විශ්‍රාමික) ජ්‍යෂ්ඨ නිලධාරි සහ මැතිණිය වන සෝනියා කෝට්ටේගොඩ මැතිණිය වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවති අතර මේ සඳහා රෙජිමේන්තු අධිපති තුමන් වන මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පි ආර්එස්පි එන්ඩියු සහ එම මැතිණිය වන රෙම ශ්‍රිලපාහ සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ලෙස කටයුතු කරණ ක්‍රිෂානි මුදලිගේ මැතිණිය මෙන්ම සේවයේ යෙදි සිටින සහ විශ්‍රාමික ජ්‍යෂ්ඨ නිලධාරින්/නිලධාරින් සහ එම මැතිණියන්ද සහාභාගි වන ලදි. එමෙන්ම ආරක්ෂක ලේකම් තුමාගේ මෙම සංචාරය සිහිකිරිම වස් රෙජිමේන්තු අධිපති තුමන් විසින් සමරු තිලිණයක් ද පරිත්‍යාග කරන ලදි.







ශ්‍රී ලංකා
පාබල හමුදා
සම්මානනීය
උත්තමාචාරයෙන්
පිදුම් ලැබ යුද හමුදා
සේවයෙන් විශ්‍රාම යන

# අභීත සෙන්පති තුමන්



වසර 35 ක අඛණ්ඩ
යුද හමුදා සේවයක්
සපුරමින් යුද්ධ හමුදාවට
නිවැරදි නායකත්වයක්
ලබාදෙමින් අභිමානවත් සේවයක්
නිමාකර යුද හමුදා සේවයෙන්
විශ්‍රාම යන අභීත සෙන්පති,

## ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති
## මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී

**2019.07.05 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණෙන ලදී.**



මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී 1964 ජුලි මස 06 වන දින වැල්ලවත්ත ප්‍රදේශයේ ඉපිද අධ්‍යාපන කටයුතු සඳහා කොළඹ නාලන්ද විද්‍යාලයට ඇතුළත්ව අධ්‍යාපන කටයුතු මෙන්ම ක්‍රිකට්, හොකී වැනි ක්‍රීඩා කණ්ඩායම්වල සාමාජිකයෙකු ලෙස ක්‍රීඩා කටයුතු ද, පාසලේ ශිෂ්‍යභට කණ්ඩායමේ කණ්ඩ භාර සැරයන් ලෙස ද කැපී පෙනෙන දක්ෂතා දැක්වූ දීප්තිමත් ශිෂ්‍යයෙකු විය. ඉන් පසු දේශයේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීම වස් වර්ෂ 1984.03.05 වන දින කෙඩෙට් නිලධාරී යෙකු වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳී මූලික පුහුණුව යුද්ධ හමුදා විද්‍යාපීඨයෙන් සම්පූර්ණ කර 1985.11.06 දින 2/ලුතිතන් වරයෙකු ලෙස අධිකාරියට පත්වන ලදී. පසුව

















කණ්ඩභාර නිලධාරියෙකු වශයෙන් 1 ශ්‍රීලපාහ ඒකකයට ඇතුලත් වන ලදී. මෙතැන් පටන් මෙම ජ්‍යෂ්ඨ නිලධාරී විසින් ශ්‍රීලපාහ ඒකකයන්ට අයත් සියලුම තනතුරු හොබවමින් රාජකාරි කල අතර, 3 වන ශ්‍රී ලංකා පාබල හමුදා බළඇණියේ විධායක අධිකාරි මෙන්ම දෙවන අණදෙන නිලධාරි වශයෙන්ද, 8 වන ශ්‍රී ලංකා පාබල හමුදා බළඇණියේ අණදෙන නිලධාරි වශයෙන්ද, නිලධාරි අණදෙන හා ප්‍රධාන උපදේශක ප්‍රති ත්‍රස්ථ හා යුධ උපක්‍රම පුපා මාදුරුඔය, මානි II හනිසඅම, ප්‍රමානි II මානෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, මානි II මනෝවිද්‍යාත්මක මෙහෙයුම් 1 කාර්ය සේනාංක මුලස්ථානය, මානි I යුසේලේශා, ප්‍රධාන උපදේශක යුහවිපි දියතලාව, කාර්ය නියුක්ත කර්නල් ප්‍රමානි 53 සේනාංකය, 534 බළසේනාවේ බළසේනාධිපති, යුධ සේවා සහයක, 516 බළසේනාවේ කාර්ය නියුක්ත බළසේනාධිපති, 552 බළසේනාවේ බළසේනාධිපති, සේනාවිධායක නගර කොට්ඨාශ මුලස්ථානය යාපනය, සේනාවිධායක යුහවිපි දියතලාව, සේනාංකාධිපති 55 සේනාංකය, ක්‍රියාන්විත අධ්‍යක්ෂ, කාර්ය නියුක්ත සේනාංකාධිපති 12 සේනාංකය, නියෝජ්‍ය උපකුලපති (ආරක්ෂක හා පරිපාලන) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ආඥාපති ආසේමු (වන්නි), සේනාවිධායක ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය බටලන්ද, මෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති වශයෙන් රාජකාරි කටයුතු සිදුකර ඇත.

මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෂ්ඨ නිලධාරි තුමන් දේශීය මෙන්ම ඇමරිකාව, ඉන්දියාව, මැලේසියාව, රුමේණියාව, පාකිස්ථානය, සහ පිලිපීනය යන රටවල උසස් විදේශීය පාඨමාලා ද හදාරා වෘත්තීය දැනුමින් මෙන්ම හැකියාවෙන් සපිරි අත්දැකීම් බහුල ජ්‍යෂ්ඨ නිලධාරිවරයෙකි. රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණි රෙජිමේන්තු අධිපති තුමන් වෙත ප්‍රධාන දොරටුව අභියසදී කඳවුරු සම්මාන මුරයක් ලබා දී පිළිගැනීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ඩීජ්කේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් එතුමන් සරඹ භූමිය වෙත කැඳවාගෙන යන ලද අතර, එහිදී යුද හමුදා සම්ප්‍රදායානුකූලව වර්ණ ධජ සහිත ඉතා අභිමානවත් සම්මාන පෙළපාලියකින් පිදුම් ලබන ලදී. ඉන් පසු පාබල හමුදා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වා දේශයේ උන්නතිය වෙනුවෙන් කායදානය කැප කරන ලද අභීත රණවිරුවන් වෙනුවෙන් තම කෘතවේදිත්වය පිරිනමන ලදී.



ඉන් අනතුරුව හය පිරිස් අමතමින් හරවත් දේශනයක් සිදුකර, රටට ස්ථිර සාමය උදාකිරීම උදෙසා දායකත්වය ලබාදුන් මියගිය, ආබාධිත හා සේවයේ සිටින සියලුම නිලධාරින් හා සෙසුනිලයින් හට ප්‍රණාමය පුද කරන ලද අතර, රෙජිමේන්තුවක් ලෙස අනාගතයේදී මුහුණ දීමට තිබෙන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දී ජයග්‍රහනයකරා යාමට ශක්තිය හා ධෛර්ය ලැබේවායි ප්‍රර්ථනා කරන ලදී. මෙම අවස්ථාවට පැමිණි සිටි සියලුම නිලධාරින් හා ජ්‍යකොනොනින් සමග සමූහ ඡායාරූපයකට පෙනීසිටි මෙම ජ්‍යෂ්ඨ නිලධාරි තුමන් සියලුම නිලයින් සමඟ තේ පැන් සංග්‍රහයකට ද එක් වන ලදී. යුද හමුදා සේවයෙන් විශ්‍රාම යන රෙජි අධිපති තුමන් හට සමුදීම සඳහා ප්‍රධාන දොරටුව අභියසට රැස්වූ සියලුම නිලධාරින් හා සෙසුනිලයින් තම සුභ පැතුම් පිළිගන්වමින් නික්ම යන රෙජි අධිපති තුමන්ගේ ඉදිරි ජීවිතය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ප්‍රර්ථනා කරන ලදී.



ඉන් අනතුරුව විශ්‍රාම ගන්නා ලද ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෂ්ඨ නිලධාරි තුමන් වෙනුවෙන් සහ එම මැතිණිය වන තුෂාරි කුලතුංග මැතිණිය වෙනුවෙන් ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ මහා කාරක සභාවේ ජ්‍යෂ්ඨ නිලධාරින්, නිලධාරින් සහ එම මැතිණියන්ගේ සහභාගීත්වයෙන් සන්ධ්‍යා කාලයේ නිලධාරි නිවස්නයේදි රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වා සමරු තිළිණයක් පිළිගන්වා මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ජ්‍යෂ්ඨ නිලධාරි තුමන් විසින් විශ්‍රාම යන රෙජිමේන්තු අධිපති තුමන්ගේ සේවය අගයමින් සහ ඉදිරි අනාගතයට සුභ පතමින් හරවත් කථාවක් පවත්වා සුභ පතන ලදී.

## ශ්‍රී ලංකා පාබල හමුදා සම්මානනීය උත්තමාචාරයෙන් පිදුම් ලැබ යුද හමුදා සේවයෙන් විශ්‍රාම යන

# අභීත සෙන්පති තුමන්



**වසර 34 ක අඛණ්ඩ යුද හමුදා සේවයක් සපුරමින් යුද්ධ හමුදාවතුල අභිමානවත් සේවයක් නිමාකර යුද හමුදා සේවයෙන් විශ්‍රාම යන අභිත සෙන්පති, මේජර් ජෙනරාල් ජේආර් අම්පෙමොහොට්ටි ආර්එස්පී 2019.07.23 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණෙන ලදී.**

රාගම මහ රෝහලේදී වර්ෂ 1964 ක් වු ජූලි මස 24 දින ප්‍රභූ පවුලක උපත ලද ජිනේන්ද්‍ර රාජිත අම්පෙමොහොට්ටි තම ප්‍රාථමික අධ්‍යාපනය ගලහිටියාව ප්‍රාථමික විද්‍යාලය වෙතින් හදාරා ඉන් පසුව වැඩිදුර අධ්‍යාපනය සඳහා කොළඹ රාජකීය විද්‍යාලය වෙත ඇතුළත් වන ලදී. පාසල් කාලය තුලදී ශිෂ්‍යයෙකු ලෙස අධ්‍යාපනය සහ විෂයානුබද්ධ භාහිර ක්‍රියාකාරකම් මෙන්ම ක්‍රීඩාවන් සඳහාද විශේෂයෙන් බොක්ෂිං ක්‍රීඩාවේ විශිෂ්ඨ කුසළතාවයන් දැක්වීම හේතුවෙන් විද්‍යාලයේ දීප්තිමත්ම ශිෂ්‍යයෙකු වශයෙන් කැපී පෙනෙන දක්ෂතාවයන් ප්‍රදර්ශනය කර ඇත.

යුද්ධ හමුදාව වෙත දක්ෂ නිලධාරීන් අත්‍යවශ්‍යම යුගයක භද්‍ර යෞවනයේදීම මාතෘ භූමිය වෙනුවෙන් සිය යුතුකම නිවැරදිව හඳුනාගනිමින් වර්ෂ 1985 ක් වු ජුනි මස 06 වන දින ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යා පීඨය වෙත තරුණ කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් මෙතුමන් ඇතුලත්වන ලදී. මූලික යුද පුහුණුව අති සාර්ථක ලෙස නිම කිරිමෙන් අනතුරුව වර්ෂ 1986 ක් වු අප්‍රේල් මස 25 වන දින දෙවන ලුතිතන් වරයෙකු වශයෙන් අධිකාරියට පත්ව අභිමානවත් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවෙහි 3 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඛණ්ඩ භාර නිලධාරියෙකු වශයෙන් අනුයුක්ත කරන ලදි.

නිලධාරියෙකු ලෙස වැදගත් තනතුරු හොබවා ඇති මෙතුමන් ලංකා ද්වීපයේ ඒකීය භාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් රුදුරු ත්‍රස්ථවාදයට එරෙහිව සටන් වැදීමේදී 1990 ඔක්තෝබර් මස 17 වැනි දින ත්‍රස්ථවාදීන්ගේ ඉලක්කයකට ගොදුරුවී ස්ථිර වෛද්‍ය වර්ගකිරීම් මත සිට වුවද තමන්ගේ රාජකාරිය මනාලෙස ඉටුකරන ලද ජ්‍යෂ්ඨ නිලධාරියෙකි. මෙම ජ්‍යෂ්ඨ නිලධාරි රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවෙහි වැඩ බලන අණදෙන නිලධාරි තනතුර හොබවන ලද අතර එහිදී එම ඒකකයේ භටපිරිස් සඳහා සිදුකරන ලද සුභසාධන කටයුතු වර්ථමානයේ වුවද එම ඒකක පැරණි සාමාජිකයින් කෘතවේදිව සිහි කරනු ලබයි. මාතෘ භූමියෙහි ඒකීයභාවය, ස්වාධීනත්වය මෙන්ම භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරිම සඳහා ලබාදී ඇති අභීත රණකාමිත්වය හේතුවෙන් මෙම ජ්‍යෂ්ඨ නිළධාරි රණශූර පදක්කමෙන් පිදුම්ලබා ඇත.

එමෙන්ම මෙම ජ්‍යෂ්ඨ නිලධාරි

හොබවන ලද වැදගත් තනතුරු ලෙස මාති I පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය, නියෝජ්‍ය අධ්‍යක්ෂ පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මානව හිමිකම් හා මානුෂවාදී නීතිය - යුහමූ යන ස්ථාන කැපී පෙනේ.

මෙතුමා ක්‍රීඩකයෙකු වශයෙන් රටවල් ගණනාවක තරගාවලි සඳහා සහභාගිවී පාබල හමුදාවට මෙන්ම යුද හමුදාවට ඉමහත් කීර්තියක් අත්කර දී ඇති අතරම සංගීතය අතින් ගත්කල ඉතා දක්ෂ සංගීත ශිල්පියෙකි. රණවිරු රියල් ස්ටාර් රියලිටි තරගාවලියේ නවක ගායකයින් සමගින් කරටකර සටනක් ලබාදුන් මෙතුමා එහි 4 වන ස්ථානය ලබා ගනිමින් පාබල හමුදාවට විශාල කීර්තියක් අත්කරදීමට සමත්වන ලද අතර, සංගීතයට අදාලව විවිධ විදේශීය සංචාර සඳහා සහභාගීවී ඒ පිලිබඳව මනා පලපුරුද්දක් හා අත්දැකීම් බහුලව ලබා ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි.

රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණි මෙම නිලධාරි තුමන් වෙත ප්‍රධාන දොරටුව අභියසදී මුරහල පසුකර යැමක් සිදුකරීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ඩීජ්කේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් එතුමන් ආචාර පීඨිකාව වෙත කැඳවාගෙන යන ලද අතර, එහිදී යුද හමුදා සම්ප්‍රදායානුකූලව වර්ණ ධජ සහිත ඉතා අභිමානවත් සම්මාන මුරයකින් පිදුම් ලබන ලදී. ඉන් පසු පාබල හමුදා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වා දේශයේ නිදහස වෙනුවෙන් තම ජීවිතය පුදකරන ලද අභීත රණවිරුවන් වෙනුවෙන් තම කෘතවේදිත්වය පිරිනමන ලදී.

ඉන් අනතුරුව භට පිරිස් අමතමින් හරවත් දේශනයක් සිදුකර, රටට ස්ථිර සාමය උදාකිරීම උදෙසා දායකත්වය ලබාදුන් මියගිය, ආබාධිත හා සේවයේ සිටින සියලුම නිලධාරින් හා සෙසුනිලයින් හට ප්‍රණාමය පුද කරන ලද අතර, මෙම අවස්ථාවට පැමිණ සිටි සියලුම නිලධාරින් සමග සමූහ ජායාරූපයකට පෙනීසිටි මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් බනිසැර නිවස්නයේදී බළලත් නිලධාරින් සහ ජ්‍යොකොනොනිත් සමඟ තේ පැන් සංග්‍රහයකට ද එක් වන ලදී.


යුද හමුදා සේවයෙන් විශ්‍රාම යන මේතුමන් හට සමුදීම සඳහා ප්‍රධාන දොරටුව අභියසට රැස්වූ සියලුම නිලධාරින් හා සෙසුනිලයින් තම සුභ පැතුම් පිළිගන්වමින් නික්ම යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ ඉදිරි ජීවිතය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ප්‍රර්ථනා කරන ලදී.

ඉන් අනතුරුව විශ්‍රාම ගන්නා ලද මේජර් ජෙනරාල් ජේආර් අම්පෙමොහොට්ටි ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් වෙනුවෙන් සහ එම මැතිණිය වන දිල්රුක්ෂි අම්පෙමොහොට්ටි මැතිණිය වෙනුවෙන් ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ මහා කාරක සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්, නිලධාරින් සහ එම මැතිණියන්ගේ සහභාගීත්වයෙන් සන්ධ්‍යා කාලයේ නිලධාරි නිවස්නයේදි රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වා සමරු තිළිණයක් පිළිගන්වා මේජර් ජෙනරාල් එච්එම්කේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් විශ්‍රාම යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සේවය අගයමින් සහ ඉදිරි අනාගතයට සුභ පතමින් හරවත් කථාවක් පවත්වා සුභ පතන ලදී.











ශ්‍රී ලංකා පාබල හමුදා සම්මානනීය උත්තමාචාරයෙන් පිදුම් ලැබ යුද හමුදා සේවයෙන් විශ්‍රාම යන

# අභීත සෙන්පතිතුමන්

**වසර 33 ක අඛණ්ඩ යුද හමුදා සේවයක් සපුරමින් යුද්ධ හමුදාවතුල අභිමානවත් සේවයක් නිමාකර යුද හමුදා සේවයෙන් විශ්‍රාම යන සෙන්පති, මේජර් ජෙනරාල් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී 2019.08.06 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණෙන ලදී.**

නාවලපිටිය මහරෝහලේදී වර්ෂ 1964 ක් වූ අගෝස්තු මස 04 දින උපත ලද මල්පොරුෑ මුදියන්සේලාගේ කිත්සිරි මූලික සිප්සතර හැදෑරීම සඳහා කටුගස්තොට මහවැලි මහ විද්‍යාලයට ඇතුලත්වන ලදි. පාසල් කාලය තුලදී ශිෂ්‍යයෙකු ලෙස අධ්‍යාපනයට සහ විෂයානුබද්ධ බාහිර ක්‍රියාකරකම් මෙන්ම ක්‍රිඩාවන් සඳහා විශිෂ්ඨ කුසලතාවයන් දැක්වීම හේතුවෙන් විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයෙකු වශයෙන් කැපීපෙනෙන දක්ෂතාවයන් දක්වා ඇත.

යුද්ධ හමුදාව වෙත දක්ෂ නිලධාරීන් අත්‍යාවශ්‍යම යුගයක හද යෞවනයේදී මාතෘ භූමිය වෙනුවෙන් සිය යුතුකම නිවැරදිව හඳුනාගනිමින් වර්ෂ 1986 ක් වූ ජනවාරි මස 16 වන දින ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යාපීඨය දියතලාව වෙත තරුණ කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් මෙතුමන් ඇතුලත්වන ලදී. මූලික යුද පුහුණුව අති සාර්ථක ලෙස නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 1987 ක් වූ මාර්තු මස 28 වන දින දෙවන ලුතිතන් වරයෙකු වශයෙන් අධිකාරියට පත්ව අභිමානවත් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවෙහි 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත බණ්ඩ භාර නිලධාරිවරයෙකු ලෙස අනුයුක්ත වන ලදි.

පාබල ඒකකයක් තුල නිලධාරියෙකු ලෙස දැරිය යුතු සියලුම තනතුරු මෙතුමා විසින් හොබවා ඇත. ලංකාද්වීපයේ ඒකීය භාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් රුදුරු ත්‍රස්ථවාදයට එරෙහිව සටන් වැදීමේදී මෙතුමන් තමන්ගේ රාජකාරිය මනාලෙස ඉටුකරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි. මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි 4 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවෙහි අණදෙන නිලධාරි තනතුර හොබවන ලද අතර මෙතුමන්ගේ නිහතමානි නායකත්වය වර්ථමානයේ වුවද එම ඒකක පැරණි සාමාජිකයින් කෘතවේදීව සිහි කරනු ලබයි. මාතෘ භූමියෙහි ඒකීයභාවය ස්වාධීනත්වය මෙන්ම භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරිම සඳහා ලබාදී ඇති අභීත රණකාමිත්වය හේතුවෙන් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි රණවික්‍රම පදක්කමින් හා රණශූර පදක්කමෙන් ද පිදුම්ලබා ඇත.

මෙතුමන් තම හමුදා ජීවිතය තුල අනුපමේය සේවාවක් යුද්ධ හමුදාව තුල සිදුකර ඇති අතර ඒ සඳහා විවිධ ස්ථානයන් වෙත තම සේවය ලබාදී ඇත. ඒ අතරින් 525 බසේමු, 613 බසේමු, 533 බසේමු, 111 බසේමු යන බළසේනා මූලස්ථානයන්හි බළසේනාධිපති

වශයෙන්ද මෙම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන්ද මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්‍ෂක වශයෙන්ද ඉටුකල රාජකාරීන් කැපී පෙනේ.

එමෙන්ම මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි දේශිය හා විදේශිය පාඨමාලා රැසක් හදාරා ඇති අතර දේශිය වශයෙන් මනෝවිද්‍යා මෙහෙයුම් පාඨමාලාව, ආපදා කළමණාකරණ පාඨමාලාව, ජාත්‍යන්තර මානුෂවාදි නීතිය පිලිබඳ උසස් සංස්කරණ පාඨමාලාව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මානවහිමිකම් ඩිප්ලෝමාවද හදාරා ඇති අතර විදේශිය වශයෙන් තරුණ නිලධාරී පාඨමාලාව - ඉන්දියාව, ජ්‍යෙෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව - ඉන්දියාව, ආසියානු පැසිපික් කලාපීය බහු ජාතීය සම්බන්ධීකරණ වැඩමුලුව - ජපානය, බලසේනාධිපති පාඨමාලාව - චීනය, එක්සත් ජාතීන්ගේ ජාතික සැලසුම් පාඨමාලාව - ඊජිප්තුව වශයෙන් පාඨමාලා රැසක් දේශීය හා විදේශීය වශයෙන් හදාරා ඇත.

තවද මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී තම රාජකාරී ජිවිතය තුල දේශීය සාමය උදෙසා පමණක් නොව ලෝක සාමය උදෙසාද විශාල කැපකිරීම් රැසක් සිදුකර ඇත. එනම් 2007 වර්ෂයේ 6 වන එක්සත් ජාතීන්ගේ සාමසාධක බළඇණියේ දෙවන අණදෙන නිලධාරි වශයෙන්ද 2012 වර්ෂයේ 16 වන එක්සත් ජාතීන්ගේ සාමසාධක බළඇණියේ අණදෙන නිලධාරි වශයෙන්ද තම රාජකාරීන් මැනවින් ඉටුකොට ඇත.

රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණි මෙම නිලධාරි තුමන් වෙත ප්‍රධාන දොරටුව අභියසදී කඳවුරු මුරයක් ලබා දී පිළිගැනීමෙන් පසු බ්‍රිගේඩියර් එච්ඩීජී රණසිංහ යූඑස්පී හා රෙජිමේන්තු මධ්‍යස්ථානය සේනාවිධායක කර්නල් ඩීජ්කේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් එතුමන් ආචාර පීඨිකාව වෙත කැඳවාගෙන යන ලද අතර, එහිදි යුද හමුදා සම්ප්‍රදායානුකූලව වර්ණ ධජ සහිත ඉතා අභිමානවත් සම්මාන මුරයකින් පිදුම් ලබන ලදී. ඉන් පසු පාබල හමුදා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වා දේශයේ නිදහස වෙනුවෙන් තම ජීවිතය පුද කරන ලද අභීත රණවිරුවන් වෙනුවෙන් තම කෘතවේදිත්වය පිරිනමන ලදී.

ඉන් අනතුරුව භට පිරිස් අමතමින් හරවත් දේශනයක් සිදුකර, රටට ස්ථිර සාමය උදාකිරීම උදෙසා දායකත්වය ලබාදුන් මියගිය, ආබාධිත හා සේවයේ සිටින සියලුම නිලධාරීන් හා සෙසුනිලයින් හට ප්‍රණාමය පුද කරන ලද අතර, මෙම අවස්ථාවට පැමිණි සිටි සියලුම නිලධාරින් සමග සමූහ ඡායාරූපයකට පෙනීසිටි මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් බනිසැර නිවස්නයේදී බළලත් නිලධාරින් සහ ජ්‍යෙකොනොනින් සමඟ තේ පැන් සංග්‍රහයකට ද එක් වන ලදී.

යුද හමුදා සේවයෙන් විශ්‍රාම යන මෙතුමන් හට සමුදීම සඳහා ප්‍රධාන දොරටුව අභියසට රැස්වූ සියලුම නිලධාරින් හා සෙසුනිලයින් තම සුභ පැතුම් පිළිගන්වමින් නික්ම යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ ඉදිරි ජීවිතය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ඉන් අනතුරුව විශ්‍රාම ගන්නා ලද මේජර් ජෙනරාල් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් වෙනුවෙන් සහ එම මැතිණිය වන රුක්මි ලොකුපතිරගේ මැතිණිය වෙනුවෙන් ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ මහා කාරක සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්, නිලධාරින් සහ එම මැතිණියන්ගේ සහභාගීත්වයෙන් සන්ධ්‍යා කාලයේ නිලධාරි නිවස්නයේදි රාත්‍රි භෝජන සංග්‍රහයක් පවත්වා සමරු තිළිණයක් පිළිගන්වා බ්‍රිගේඩියර් එම්ඩී විජේසුන්දර ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් විශ්‍රාම යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සේවය අගයමින් සහ ඉදිරි අනාගතයට සුභ පතමින් හරවත් කථාවක් පවත්වන ලදී.









# ශ්‍රීලපාහ නව රෙජිමේන්තු අධිපති තුමන්ගේ ප්‍රථම ඒකක සංචාරය





**අරක්ෂක සේනා ආඥාපති (බටහිර) සහ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ දසවෙනි රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ජ්‍යේෂ්ඨ නිලධාරි තුමන් 2019 ජූලි මස 26 වන දින රෙජිමේන්තු මූලස්ථාන බැළඇණියේ කඳවුරු සංචාරයෙහි නිරත විය.**

කඳවුරු පරිශ්‍රයට පැමිණි ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් හට කඳවුරු සම්මාන මුරයක් පිරිනමමින් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ආර්එම්එස් රාජකරුණා ශ්‍රීලපාහ ජ්‍යෂ්ඨ නිලධාරි ඇතුලු ඒකකයේ සියලු නිලයින් විසින් ඉමහත් හරසරින් පිළිගන්නා ලදී.

සංචාරය සිහිවීම පිණිස බූස්ස කඳවුරු පරිශ්‍රයේ පැළයක් රෝපණය කරන ලද රෙජිමේන්තු අධිපති තුමන් හට ඒකක අණදෙන නිලධාරි තුමා විසින් ඒකකයේ සිටින රණක්ෂිතයට පත් සෙනීන් වෙනුවෙන් සිදුකරනු ලබන සුබ සාධන වැඩසටහන් හා දැනට කඳවුරේ සංවර්ධන කටයුතු හා අවශ්‍යතා සැබැදිව පැහැදිලි කිරීමක් සිදුකිරීමෙන් අණතුරුව රෙජිමේන්තු අධිපති තුමා විසින් ඒකකයේ සියලු භටපිරිස් අමතන ලදී. පසුව කඳවුර පුරා නිරීක්‍ෂණ චාරිකාවක යෙදුනු අතර, එහිදී රණක්ෂිතයට පත් සෙනීන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීම සැබැදිව අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදෙන ලදී. තවද, රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරිවරයෙකු ප්‍රථම වරට ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති ලෙස පත්වීම හා සිය ප්‍රථම ඒකක සංචාරය ලෙස මෙම බළඇණිය තෝරා ගැනීම රෙම ශ්‍රීලපාහ මූලස්ථාන බළඇණියේ ඉතිහාසයට එක්වන සුවිශේෂී සිදුවීමකි.



# රෙජිමේන්තු අධිපති තුමන්ගේ

# රේඛ ශ්‍රීලපාහ ඒකක සංචාරය



**ශ්‍රී ලංකා පාබල හමුදාවේ 10 වන රෙජිමේන්තු අධිපති ලෙස පත්වූ මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ ශ්‍රීලපාහ ඒකක සංචාරය 2019.08.16 වන දින 8 ශ්‍රීලපාහ ඒකකයෙන් ආරම්භ කරන ලදී. ශ්‍රීලපාහ ඒකකයන් හි නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ අවශ්‍යතා පිළිබඳ සහ ඔවුන්ගේ ඉදිරි අභිවෘද්ධිය සඳහා වූ සියලු පාලන කටයුතු විධිමත්ව සිදුකිරීම පිළිබඳව සොයාබැලීම මෙම ඒකක සංචාරයේ මූලික පරමාර්ථය විය.**

සංචාරයේ පළමු අදියර ආරම්භ කරමින් 2019.08. 19 වන දින 1 ශ්‍රීලපාහ - මුල්ලියාවේලි , 12 ශ්‍රීලපාහ - මුලතිව් සහ 14 (සෙව්) ශ්‍රීලපාහ - වැලිඔය යන ඒකක වල සංචාරය සිදුකරන ලදී. මෙම සංචාරය සිදුකිරීමට පෙර රෙජිමේන්තු අධිපති තුමන් විසින් ආරක්ෂක සේනා අණදෙපති (මුලතිව්) මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ඒඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පි ආර්එස්පි යුඑස්පි එන්ඩිසි පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් බැහැදැකීම විශේෂයෙන් සිහිපත් කල යුතුයි. තවද 14(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ ප්‍රයෝජනය සඳහා නවතමයෙන් ඉදිකරන ලද කරණවෑමි හල සහ මැහුම් හල රෙජිමේන්තු අධිපති තුමන්ගේ සුරතින් විවෘත කිරීම ද මෙදින සිදුවිය.

ශ්‍රීලපාහ ඒකක සංචාරයේ දෙවන අදියර ආරම්භ කරමින් 2019 සැප්තැම්බර් මස 10 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) සහ ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චි) යටතේ ස්ථාපිත ඒකකයන්හි සංචාරය කරන ලදී. දෙවන දිනයේදී 2019 සැප්තැම්බර් මස 11 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (කිළි) යටතේ ස්ථාපිත ඒකකයන්හි සංචාරය කරන ලදී. මෙදින 7 ශ්‍රීලපාහ, 17 (සෙව්) ශ්‍රීලපාහ සහ 10 ශ්‍රීලපාහ යන ඒකක වල සංචාරය සිදුකරන ලද අතර ශ්‍රීලපාහ ඒකක සංචාරයේ තුන්වන අදියරේ දී 2019 සැප්තැම්බර් මස 22 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ ස්ථාපිත ඒකකයන්හි සංචාරය කරන ලදී. මෙදින 23 ශ්‍රීලපාහ, 24 ශ්‍රීලපාහ සහ 5 (සෙව්) ශ්‍රීලපාහ යන ඒකක වල සංචාරය සිදුකරන ලදී. 24 ශ්‍රීලපාහ ඒකකයේ අභිනවයෙන් ඉදිකිරීමට නියමිත අඩි 25 x 75 ප්‍රමාණයේ දේශන ශාලාව සඳහා මුල්ගල තැබීම හා 5(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ අර්ධ ස්ථිර 20 x 80 ප්‍රමාණයේ භට නිවාසයක් විවෘත කිරීම ද මෙහිදී විශේෂයෙන් සිහිපත් කල යුතුය.

මෙම සංචාරය සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ඩීජ්කේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් සමගින් රෙජිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද සහභාගී විය.



# යුද හමුදාවේ ඉහළ තනතුරු දරන
# ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්



## නිලධාරි ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ (OCDC) සේනාවිධායක

නිලධාරි ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ **(OCDC)** සේනාවිධායක ලෙසින් 2019.09.16 වන දින අභිනවයෙන් ධූරයේ රාජකාරි භාරගන්නා ලද බ්‍රිගේඩියර් කේජේ ජයවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් ජ්‍යෙෂ්ඨ නිලධාරි



## 232 බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති

232 බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති ලෙසින් 2019 අගෝස්තු මස 30 වන දින අභිනවයෙන් ධූරයේ රාජකාරි භාරගන්නා ලද කර්නල් ඩබ්ලිව්එස්කේ ලියනවඩුගේ ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි



## 622 බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති

622 බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති ලෙසින් 2019 සැප්තැම්බර් මස 02 වන දින අභිනවයෙන් ධූරයේ රාජකාරි භාරගන්නා ලද කර්නල් ඩීඑම්සීපී විජයරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි



## 574 බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති

574 බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති ලෙසින් 2019 සැප්තැම්බර් මස 12 වන දින අභිනවයෙන් ධූරයේ රාජකාරි භාරගන්නා ලද කර්නල් වීඩීඑස් පෙරේරා ජ්‍යෙෂ්ඨ නිලධාරි

# සුබ මොහොතින් නව තනතුරට පත්වූ ඔබට

## රෙජිමේන්තු අධිපති ඇතුලු සියලු නිලයින්ගේ උණුසුම් සුභපැතුම්



දෙවන අණදෙන
නිලධාරී
11 ශ්‍රීලපාහ
නි/65072 මේජර්
SSA නාරායනගේ
ශ්‍රීලපාහ



දෙවන අණදෙන
නිලධාරී
1 ශ්‍රීලපාහ
නි/65385 මේජර්
DLK කොල්ලුරගේ
RWP RSP ශ්‍රීලපාහ



දෙවන අණදෙන
නිලධාරී
20 ශ්‍රීලපාහ
නි/65680 මේජර්
WKIK බෝගොඩ
RWP ශ්‍රීලපාහ



ප්‍රකාශණ/තුවාක
අංශ භාර නිලධාරී
රෙම ශ්‍රීලපාහ
නි/6009 මේජර්
PLA වික්‍රමසිංහ
ශ්‍රීලපාහ



ක්‍රියා හා පුහුණු භාර
නිලධාරී
11 ශ්‍රීලපාහ
නි/67994 මේජර්
MAGA නිලංග
ශ්‍රීලපාහ



විධායක අධිකාරී
11 ශ්‍රීලපාහ
නි/68907 කපිතන්
AMGK අත්තනායක
ශ්‍රීලපාහ



බුද්ධි නිලධාරී
6 ශ්‍රීලපාහ
නි/70644 ලුතිතන්
WIU දන්දෙනිය
ශ්‍රීලපාහ



බුද්ධි නිලධාරී
11 ශ්‍රීලපාහ
නි/70676 ලුතිතන්
TSR මෙන්ඩිස්
ශ්‍රීලපාහ



උපකරණ පාලක
නිලධාරී
11 ශ්‍රීලපාහ
නි/66226 කපිතන්
(උපා) HMLA හේරත්
USP ශ්‍රීලපාහ



උපකරණ පාලන
නිලධාරී
9 (සෙවි) ශ්‍රීලපාහ
නි/10557 ලුතිතන්
(උපා) KWSN
කරුණාදාස ශ්‍රීලපාහ



රෙජිමේන්තු
සැරයන් මේජර්
7 ශ්‍රීලපාහ
සෙ/315376 ඔනි 11
දිසානායක DKR
RSP



රෙජිමේන්තු
සැරයන් මේජර්
8 ශ්‍රීලපාහ
සෙ/316907 ඔනි 11
ගමගේ GC



සරඹ උපදේශක
9(සෙවි) ශ්‍රීලපාහ
සෙ/9ඩ00588
සැරයන්
ප්‍රේමලාල් YGA



ප්‍රධාන සරඹ
උපදේශක
11 ශ්‍රීලපාහ
සෙ/318455 සැරයන්
කුමාර හේරත්
RMS RWP RSP



ප්‍රධාන ලිපිකරු
11 ශ්‍රීලපාහ
සෙ/319647 සැරයන්
අත්තනායක
AMN RSP



ප්‍රධාන ලිපිකරු
9 (සෙවි) ශ්‍රීලපාහ
සෙ/9ඩ00706
සැරයන්
කුමාර ADSR



## ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ නව සභාපති තුමිය

# ක්‍රිෂානි මුදලිගේ

ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපති තුමිය වශයෙන් ක්‍රිෂානි මුදලිගේ මැතිණිය 2019.07.11 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සුභ මොහොතින් තම ධූරයේ රාජකාරී භාරගන්නා ලදී.







## ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ

# මහා සභා රැස්වීම



ගරු උප සභාපතිතුමිය
චායා ගුණරත්න



ගරු ලේකම්තුමිය
ක්‍රිෂානි වඩුගොඩපිටිය



ගරු උප ලේකම්තුමිය
අනූජා ජයවීර

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපති තුමියගේ ප්‍රධානත්වයෙන් 2019 වර්ෂයේ මහාසභා රැස්වීම 2019.07.28 වන දින රෙම ශ්‍රීලපාහ දේශණ ශාලාවේදී පවත්වන ලදී. එහිදී මියගිය, රණඝෂිතයට පත් සහ සේවයේ යෙදී සිටින නිලධාරින් සහ සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන්ගේ පවුල් වල ලගම ඥාතීන් වෙනුවෙන් ඉදිරියේදී සිදුකිරීමට නියමිත සුභසාධන කටයුතු සබැඳිව විශේෂයෙන් සාකච්ඡා කල අතර රණවිරු සුභසාධන කටයුතු පිළිබඳවද සාකච්ඡා කරන ලදී. මෙහිදි තනතුරු සඳහා නව පත්වීම් සිදුකරන ලද අතර ගරු උප සභාපති තුමිය වශයෙන් චායා ගුණරත්න මැතිණියත්, ගරු ලේකම්තුමිය වශයෙන් ක්‍රිෂානි වඩුගොඩපිටිය මැතිණියත්, ගරු උප ලේකම්තුමිය වශයෙන් අනුජා ජයවීර මැතිණියත් පත්වීම් ලැබූහ, තවද කාරක සභාව වශයෙන් ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් 05 දෙනෙකු ද පත් කරන ලදී.

# ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛා සභාපති තුමියගේ
# පනාගොඩ විරු කැකුළු පෙර පාසල් සංචාරය



ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපති තුමිය 2019.09.19 වන දින පනාගොඩ විරු කැකුළු පෙර පාසලේ අධීක්ෂණ චාරිකාවක නිරත වන ලදී. එහිදී එම පෙර පාසලේ අවශ්‍යතාවයන් පිලිබඳව එහි භාරව කටයුතු කරනු ලබන යුද්ධ හමුදා නිලධාරිණියන් සමග සාකච්ඡා කල අතර එම අවශ්‍යතාවයන් කඩිනමින් ඉටුකර දීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව පවසන ලදී. තවද මෙම අවස්ථාවේදී පෙර පාසලේ කුඩා ළමුන් පිරිසක් විසින් අලංකාරවත් නර්තනයක් ද ඉදිරිපත් කරන ලදී.







# ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ
# මූල්‍යමය හා වෛද්‍යාධාර පිරිණැමීම



කපිතන් ජේඑච්ඒ ජයරත්න (මියගිය) ලඟම ඥාතියා වෙත ආධාර පිරිණැමීම



සාසෙ සමුද්‍ර බී වෙත ආධාර පිරිණැමීම



බනි 1 එන්එස් ගුරුසිංහ (විශ්‍රාමික) වෙත ආධාර පිරිණැමීම

පාබල හමුදා සේවා වනිතා ඒකකය මගින් 2019.07.31 වන දින 4 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙබලුන් තිදෙනෙකු වෙනුවෙන් මූල්‍යමය හා වෛද්‍යාධාර පිරිනැමීම සිදුකෙරිණ. මෙම වැඩසටහනට අනුව එම ඒකකයට අයත් කපිතන් ජේඑච්ඒ ජයරත්න ශ්‍රීලපාහ (මියගිය) ගේ බිරිඳ වෙත තිවාසාධාර ලෙස රු. 200000.00ක් ද, බනි 1 එන්එස් ගුරුසිංහ (විශ්‍රාමික) හට රු. 100000.00ක් ද සහ සාසෙ සුමුද්‍ර බී හට වෛද්‍යාධාර ලෙස රු. 6000.00ක් ද රෙජිමේන්තු සේනාවිධායක තුමන් සුරතින් පිරිනමන ලදී.



## රණවිරුවෙකුගේ නිවසේ ඉදිරි වැඩ නිමකර ගැනීම සඳහා

# සේවා වනිතා නිවාසාධාර

ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාව වෙතින් දියත් කරනු ලබන ප්‍රජාසත්කාර වැඩසටහන් අතුරින් තවත් එක් වැඩසටහනක් ක්‍රියාවට නංවමින් ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිතුමිය වන තුෂාරි කුලතුංග මැතිණියගේ උපදෙස් සහ මග පෙන්වීම යටතේ සේවාවනිතා ශාඛාව වෙතින් රු.939732.00 ක මුදලක් වැයකර 23 ශ්‍රීලපාහ ඒකකයේ ශ්‍රම දායකත්වය ඇතිව මොරගහමඩ, කුඹල්ඔලුව, ඉඹුල්ගොල්ල, මාතලේ ප්‍රදේශයේ පදිංචි සෙ/331992 සාසෙ ඉෂාර කේඩීඑස් යන සෙනීගේ අඩක් නිමකර ඇති නිවසේ ඉතිරි වැඩකටයුතු නිමකරන ලදී. එම නිවස ශ්‍රීලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ඩීජ්කේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සුරතින් 2019.07.01 වන දින 1130 පැයට යෙදී තිබූ සුභ මොහොතින් විවෘත කර තත් සෙනී හට නිවසේ යතුර භාරදෙන ලදී. ඒ සඳහා 23 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි මේජර් එච්එම්එම්පී හේරත් ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සහ රෙම ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ සම්බන්ධීකරණ නිලධාරි වන මේජර් අයිජ්එල් ඉලේපෙරුම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි ඇතුලු සෙසු සාමාජිකයින් පිරිසක් ද සහභාගී වන ලදී.





# ආසේමු (මුලතිව්) බලප්‍රදේශය තුල පැවැත්වූ බලඇණි පුහුණුවීම් වලදී සියළු බලඇණි අභිබවා වැඩිම ලකුණු ප්‍රතිශතයක් ලබාගනිමින් අභිෂේක ලැබූ 1 ශ්‍රීලපාහ

2019/05/21 වන දින බලඇණි පුහුණුව ආරම්භ වූ අතර, ඒ සඳහා නිලධාරින් 09 සහ සෙසුනිලයින් 274 දෙනෙකු සහභාගි විය. සියලු අභියෝග ජය ගනිමින් බලඇණියේ නිලධාරින් සහ සියලුම සෙනින් එකමුතුව සහ ධෛර්‍යයෙන් පුහුණුවීම් වල නිරත වූහ. අණදෙන නිලධාරි තුමාගේ සංකල්පයක් මත පුහුණු කාලසීමාව තුලදි නිලධාරින් සහ සෙසුනිලයින්ගේ මානසිකත්වය ඉහල මට්ටමක පවත්වා ගැනීම සඳහා සැහැල්ලු පන්දු ක්‍රිකට්, අත්පන්දු සහ කඹ ඇදිම වැනි තරග තුලින් නව ක්‍රීඩකයින්ගේ සැගවුනු දක්ෂතා රැසක් ඉස්මතු වීම කැපීපෙනුනි. තවද, අණදෙන නිලධාරි තුමන්ගේ සංකල්පයක් මත ඉතා විශේෂ සිදුවීමක් ලෙස ජුනි මාසය තුල උපන් දිනය යෙදි තිබු සෙසුනිලයින් 17 දෙනෙකුගේ උපන් දින සැමරුම පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක තුමා හා සියලු උපදේශක මඩුල්ලද, 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි තුමන් ඇතුලු සියලු නිලධාරින් සහ සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් උපන්දින සාදයක් ඉතා ඉහලින් පවත්වන ලදී. මෙම සිදුවීම සියලු නිලයින්ගේ පැසසුමට ලක්වු අතර, මේ තුලින් සියලු නිලයින්ගේ මානසිකත්වය ඉහල නැංවිමට හැකි විය.

මෙවර බලඇණි පුහුණුවීම් වලදී වැඩිම ලකුණු ප්‍රමානයක් ලබාගනිමින් ඒකකය දැක්වූ දක්ෂතාවයන් පහත සඳහන් පරිදි වන අතර, ආසේමු (මුලතිව්) බලප්‍රදේශය තුල මේ දක්වා බලඇණි පුහුණුවීම් සිදුකල බලඇණි අතරින් ඉහලම ලකුණු ප්‍රතිශතයක් 1 ශ්‍රීලපාහට ලබාගැනීමට හැකි විය.

**හොඳම කණ්ඩායම "ඩී" (83.61%), දක්ෂතම වෙඩික්කරු සෙ/318294 සැරයන් වීරතුංග එම්එස් (ආර්එස්පි) "ආධාරක" කණ්ඩායම, සැම අතින්ම අතිශූර සෙබලා සෙ/319100 සාසෙ නායිදු යුසි "සී" කණ්ඩායම, දක්ෂතම නිලධාරි අණදෙන නි/69689 කපිතන් ඊඑම්ඩි ඒකනායක ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම, හොදම ශාරීරික යෝග්‍යතාවයෙන් පිරිපුන් ශිෂ්‍යයා සෙ/333397 සාසෙ ජයරත්න ඊඑම්එල්එස් "ඒ" කණ්ඩායම, හොදම පෙළ අණ දෙන්නා සෙ/322382 කෝප්‍රල් රණසිංහ පීඩිඑස්කේ "සී" කණ්ඩායම,**

පුරා මාස දෙකකට ආසන්න කාලයක් පැවති පුහුණු කටයුතු 2019.07.12 වන දින සාර්ථකව නිමකරන ලදී. අවසන් දේශනය සඳහා ආරක්ෂක සේනා මුලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ජ්ඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩීසී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් සිදුකරන ලද අතර, නිලධාරි සහ සෙනින්ගේ දක්ෂතාවයන් හා බලඇණිය ලබාගත් ලකුණු ප්‍රතිශතය පිලිබඳව ඉමහත් ප්‍රසංසනාත්මකව අගයන ලදී. මෙහිදී බලඇණි පුහුණු පාඨමාලාවේ හා කණ්ඩායම් තරග වලදි දක්ෂතා දැක්වූවන් හට සම්මාන සහ සහතික පත්‍ර ප්‍රදානයද සිදුවිය.

# 32 5 වන බළඇණිය සිය 32 වන බළඇණි සංවත්සරය අභිමානයෙන් සමරයි



**පාබල හමුදා රෙජිමේන්තුව තුල පැරණි බළඇණියක් වන 5 (සෙව්) ශ්‍රීලපාහ ඒකකය සිය 32 වන බළඇණි සංවත්සර උළෙල ඒකකයේ අණදෙන නිලධාරි මේජර් එන්බීඒයූකේ නිශ්ශංක ආර්එස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ප්‍රධානත්වයෙන් 2019.08.15 දින අභිමානවත්ව ඒකක මූලස්ථානය ස්ථානගත ගජසිංහපුර යුද්ධ හමුදා කඳවුරේදී පවත්වන්නට විය.**

1987.08.15 දින 5 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව නමින් මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ ස්ථාපිත කරන ලද මෙම ඒකකය දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි ක්‍රියාන්විත රාජකාරි වල යෙදෙමින් අප රටේ භෞමික අඛණ්ඩතාවය හා ස්වෛරීභාවය ආරක්ෂාකර ගැනීමට ඉමහත් කැපවීමක් සිදුකරන්නට විය. පුරා දශක කීපයක් පැවැති රුදුරු ත්‍රස්ථවාදය නිසා දිවිපිදූ සහ තුවාල ලැබූ රණවිරුවන්ද සේවයේ නියුතු සහ විශ්‍රාම ලැබූ සියලු රණවිරුවන්ද ඔවුන්ගේ පවුල්වල අයවලුන්ද සිවිල් සේවක මහතුන් ඇතුලු සියලුම දෙනා සිහිකොට වරු පිරිත් සජ්ඣායනයක් සිදුකරමින් පුණ්‍යානුමෝදනා සිදුකරන්නට විය.

තවද 32 වන බළඇණි සංවත්සර දිනට සමගාමීව ඒකක අණදෙන නිලධාරි හට සම්මාන පෙළපාලියක් පිරිනැමූ අතර, ඒදින සිහි වටනයක් ලෙස අණදෙන නිලධාරි විසින් අඹ පැලයක් රෝපණය කරන ලදී. මෙම බළඇණි සංවත්සරය සාර්ථකව සිදුකරගැනීමට 21සේනාංකය, 213 බළසේනාව, රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ සහ ප්‍රදේශයේ ස්ථානගත අනෙකුත් බළඇණි වෙතින් ලබාදුන් දායකත්වය මෙහිලා විශේෂයෙන් සඳහන් කලයුතුය.







6 ශ්‍රීලපාහ ඒකකයේ රාජකාරීන්හි නිරතව සිටියදී මියගිය විරෝධාර රණවිරුවන් උදෙසා 19 වරටත් පැවැත්වූ

# රණවිරු පිංකම් මාලාව





**වසර 30 කට ආසන්න කාලයක් පුරා පැවති ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් මෙම ඒකකය සමගින් රාජකාරී කරමින් සිටියදී මියගිය හා අතුරුදහන් විරෝධාර රණවිරුවන් 464 දෙනෙකු වෙනුවෙන් 6 ශ්‍රීලපාහ රණවිරු සංගමය වාර්ෂිකව සංවිධානය කරනු ලබන රණවිරු පිංකම් මාලාව 19 වන වරටත් ඒකකයේ වත්මන් අණදෙන නිලධාරී මේජර් එම්ඒඒපී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ඇතුලු ඒකකයේ සියළු නිලයින්ගේ ආරාධනයෙන් ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ හා රණවිරු දෙමපියන්ගේ සහභාගීත්වයෙන් 2019 ජුනි මස 22 හා 23 යන දිනයන් හිදි ඒකකය ස්ථානගත මහකනදරාව, මිහින්තලය කඳවුරේදී අති උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදී.**

මෙදින බෝගහයාය විහාරස්ථානයේදී රණවිරු දෙමපියන් විසින් පැවැත්වූ ආගමික වාතාවත්වලින් අනතුරුව සධාතුක කරඬුව සිංහල සංස්කෘතිකාංගයන්ගෙන් පරිපූර්ණව කඳවුර තුල පිහිටි රණවිරු අනුෂ්මරණ ශාලාව වෙත වැඩමවා ශාලාව තුල ඉදිකල මනස්කාන්ත පිරිත් මණ්ඩපය තුල ඒකකයේ අණදෙන නිලධාරි තුමන් විසින් තැන්පත් කරන ලදී

ඉන් අනතුරුව ජීවිත දානය පුදකල උදාරතර රණවිරුවන්ට පිං අනුමෝදන් කරමින්, ආබාධිත රණවිරුවන්හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් හා සමස්ථ යුද්ධ හමුදාවටත් ලක්වාසි ජනතාවටත් සෙත් පතා පසුදින පහන් වනතුරු පිරිත් දේශනාවක් පවත්වන ලදී. 2019 ජුනි 23 වන දින උදෑසන සංඝයා වහන්සේලා තිස්පස්නමක් වෙත හිල් දානය පිළිග න්වා පිංකම් මාලාවේ සමාප්තිය සනිටුහන් කරන ලදී.

6 ශ්‍රීලපාහ අභිනවයෙන් ඉදිකරන ලද

# බෝධි ප්‍රාකාරය විවෘත කිරීම





**සෙ/13850 සැරයන් තිලකරත්න එම (මයගිය) ජේකොනොනි ඇතුළු සියළු රණවිරුවන් හට පිං පිණිස ඔහුගේ ආදරණීය බිරිද, 6 ශ්‍රීලපාහ රණවිරු සංගමයේ කාරක සභික කුසුමලතා මාවඩවිලගේ මහත්මියගේ පූර්ණ ධන පරිත්‍යාගයෙන් යුතුව ඒකකයේ අණදෙන නිලධාරී මේජර් එම්ඒඒපී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සි ගේ සංකල්පයට අනුව ඒකකයේ සියළු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිවූ බෝධි ප්‍රාකාරය 2019.09.02 දින කුසුමලතා මාවඩවලගේ මහත්මියගේ සුරතින් විවෘත කරන ලදී.**

# 57 සේනාංකාධිපති තුමාගේ 7 ශ්‍රීලපාහ ඒකක සංචාරය

**57 සේනාංකයේ 13 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීපීඑස් ද සිල්වා ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් තනතුරේ වැඩ භාරගැනිමෙන් පසු ප්‍රථම ඒකක සංචාරය සමාරම්භ කරමින් 2019.09.11 වන දින 7 ශ්‍රීලපාහ ඒකකයට පැමිණි අතර ඒකකයේ අණදෙන නිලධාරි මේජර් කේඑම්එම්කේබී කඩවතමුදලි ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ විසින් මහත් හරසරින් පිලිගන්නා ලදී.**



සේනාංකාධිපති තුමන් ඒකකයට පැමිණීමට ප්‍රථමයෙන් ඒකක භට පිරිස් පිටත රාජකාරි සඳහා යොදවා ඇති ස්ථානයන්හි සංචාරය කර අනතුරුව ඒකක වෙත පැමිණ සංචාරය සිහිකරීම වස් අඹ පැළයක්ද රෝපණය කරන ලදී. ඉන් පසු නිලධාරි නිවස්නයේදී අණදෙන නිලධාරි විසින් සේනාංකාධිපති තුමන් හට ඒකකයේ රාජකාරි පිළිබඳව පැහැදිලි කිරීමක් සිදුකරීමෙන් පසු දේශණ ශාලාවේදී සේනාංකාධිපති තුමා ඒකක භට පිරිස් ඇමතීම සිදුකරන ලදී. එහිදි රාජකාරි සිදු කිරීමේදී ඒවා නිසි විනයකින් යුක්තව ඉටුකල යුතු පිළිවෙල හා සිවිල් වැසියන් සමග කටයුතු කළයුතු ආකාරය පිලිබඳ සෙනින් දැනුවත් කරන ලදී.




ඉන් පසුව ඒකකයේ නිරීක්ෂණ සංචාරයක් සිදුකිරීමෙන් අනතුරුව නිලධාරි නිවස්නයේ සුදානම් කර තිබු සුහද හමුවට සහභාගී වූ සේනාංකාධිපති තුමා පසුව අමුත්තන්ගේ සටහන් තැබීමේ ග්‍රන්ථයෙහි තම අත්සන සටහන් තබමින් ඒකකයෙන් නික්ම යන ලදී.



# අභිනවයෙන් ඉදිවන 8 ශ්‍රීලපාහ සෙසුනිල දෙමහල් ගොඩනැගිල්ලට මුල්ගල තැබීම



**8 ශ්‍රීලපාහ ඒකකයේ රාජකාරී නියුතු සෙසුනිලයින් හට දීර්ඝ කාලීන අවශ්‍යතාවයක්ව පැවති පරිපාලන හා නවාතැන් පහසුකම් සඳහා නව ගොඩනැගිල්ලක බලාපොරොත්තුව සඵල කරමින් අණදෙන නිලධාරී මේජර් එන්ඩබ්ලිව්ඩීඒ නානායක්කාර ආර්එස්පී යුඑස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සංකල්පයකට අනුව එතුමන්ගේ සුරතින් 2019.08.08 වන දින යෙදී තිබූ සුභ මොහොතින් සෙසුනිල නව දෙමහල් ගොඩනැගිල්ල සඳහා මුල්ගල් තබන ලදී.**

මෙම සුභ කටයුත්ත සඳහා ඒකකයේ සියලුම නිලධාරීන්, රෙජිමේන්තු සැරයන් මේජර් හා සෙසුනිලයින් සහභාගි වන ලදී. තවද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකර සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදීම සියලුම අණදෙන නලිධාරි තුමන්ගේ අභිප්‍රායයි.







# 9 (සෙව්) ශ්‍රීලපාහට ඔසු උයනක්



අණදෙන නිලධාරී තුමන්ගේ සංකල්පයක් මත ශ්‍රී ලංකාවෙන් සීඝ්‍රයෙන් වඳවෙමින් යන ඉපැරණි ඔසු පැළෑටි සමගින් අලංකාරවත් ඔසු උයනක් ඒකක මූලස්ථානය පිහිටි කැළණිමුල්ල කඳවුරු පරිශ්‍රය තුල ඉදිකරන ලද අතර 2019.07.18 වන දින සියලු දෙනාගේ ප්‍රයෝජනය සඳහා අණදෙන නිලධාරී තුමන් අතින් විවෘත කරන ලදී.

## 9 (සෙව්) ශ්‍රීලපාහ නවතමයෙන් ස්ථාපනය කරන ලද යතුරුපැදි ඛණ්ඩය



දැනට රටෙහි පවතින ආරක්ෂක තත්වය හේතුවෙන් විවිධ රාජකාරි ඉටුකිරීමේදී මෙම ඒකකය වෙත පැවරී ඇති රාජකාරි ස්වභාවය මත සමූහ මෙහෙයුම් ආඥා මූලස්ථාන, 14 සේමු සහ 142 බසේමු උපදෙස් හා මගපෙන්වීම මත ඒකක අණදෙන නිලධාරි මේජර් එඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ඒකක හයිපිරිස් 01 x 11 දෙනෙකුගෙන් සමන්විත යතුරුපැදි ඛණ්ඩයක් ස්ථාපනය කරන ලදි.

# 12 11 වන බළඇණිය සිය 12 වන බළඇණි සංවත්සරය අභිමානයෙන් සමරයි





**11 ශ්‍රීලපාහ 12 වන බළඇණි දින සංවත්සරය 2019 ජූනි මස 25 වන දින ඒකක අණදෙන නිලධාරී මේජර් කේපීසී ධර්මසිරි ආර්එස්පී යූඑස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ ප්‍රධානත්වයෙන් කරෙයිනගර් කදවුරේදී පැවැත්වුනි. සංවත්සර දිනයට සමගාමීව ඒකකය තුල වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක කෙරිණ.**

2019.06.16 වන දින ලේ දන්දීමේ වැඩසටහනක් ද 2019/06/21 වන දින ඒකක අණදෙන නිලධාරිතුමන් හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක්ද පවත්වන ලද අතර එදින සියලු නිළ භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදී. තවද කරෙයිනගර් ශිවම් කෝවිලෙහි දේව පූජාවක්ද පවත්වා ඒකකයේ ධජයන්ට සෙත් පැතිම සිදු කරන ලදී. ඉන්පසු දින පසුගිය තිස්වසරක කරිරු යුද්ධයෙදී මව්බිම වෙනුවෙන් දිවි පිදූ ඒකකයේ රණවිරුවන් 04 x 206ක් හා වෙනත් හේතුන් මත මියගිය 17ත් දෙනෙකුගේ දෙමාපියන්, බිරින්දෑවරුන් හා දූවා දරුවන් සහ ඥාතීන් සමගින් 2018/06/23 වන දින උල්පත පුරාණ රජමහා විහාරස්ථානයේ සංඝයාවන්සේලා සිව්පස් නමක් කදවුර වෙත වැඩමකරවා කදවුරු භූමියේ ඉදිකර ඇති විහාරස්ථානයේ දී පුණ්‍යානුමෝදනාවක් සිදුකර මහා සංඝරත්නය වෙත දවල් දානය පූජා කරන ලද අතර සන්ධ්‍යාවේදී මියගිය රණවිරුවන් සිහිකරනුවස් පුෂ්පෝපහාරයක් සිදුකරන ලදී.

12 වැනි බළඇණි දිනය වර්ණවත් කරමින් ඒකක සෙසුනිළයින් වෙනුවෙන් 2018/06/26 වන දින රාත්‍රියේ කරෙයිනගර් මුහුදු වෙරළේ සංගීත ප්‍රසංගයක් පවත්වන ලදී. 2018/06/30 වන දින බනිසැර නිවස්නයේ විශ්‍රාම ලබා සිටින අයවලුන් වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් හා සුහද හමුවක් ද පවත්වා බළඇණි දින සැමරුම නිමාවට පත් කරන ලදී.





# 12 වන බළඇණිය සිය 12 වන බළඇණි සංවත්සරය අභිමානයෙන් සමරයි



**බළඇණිය පිහිටුවා 2019.12.03 වන දිනට වසර දොලහක් සපිරීම නිමිති කොටගෙන ශ්‍රී ලංකා පාබල හමුදාවේ රණකාමී පාබල ඒකකයක් ලෙස බලඇණි දින සංවත්සර උත්සවය සමරනු ලැබුවේ මහත් වූ අභිමානයෙනි.**

ඒකකයේ අණදෙන නිලධාරී මේජර් කේජීආර්සී කුමාර ආර්එස්පී යූඑස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් සහ ඒකකයේ සියළුම නිලධාරි හා සෙසු නිලයන්ගේ සහභාගීත්වයෙන් යුතුව 2019.12.01 දින චාරිත්‍රානුකූලව මහා සංඝරත්නය වඩමවා සුමදුර ධර්ම දේශණාවක් පවත්වා පුණ්‍යානුමෝදනාවක් සිදුකරන ලදී. 2019.12.02 දින මුලතිව් වට්ටප්පලෙයි අම්මාන් කෝවිලේදී සියලු නිළයන්ට දේවාශීර්වාද පතා දේව පූජාවක්ද පවත්වන ලදී.

පසුව, 2019.12.03 වන දින ඒකක අණදෙන නිලධාරි තුමන් හට සම්මාන මුරයක් සහ සම්මාන පෙලපාලියක් පිරිනමන ලදී. ඉන් අනතුරුව සියලු නිළයින් සඳහා දිවා භෝජන සංග්‍රහයක්, ද 2019 12 04 වන දින සංගීත ප්‍රසංගයක් ද පවත්වා සංවත්සර උත්සවයේ කටයුතු නිමාවට පත්කරන ලදී.

## අභිනවයෙන් ඉදිකරන ලද 12 ශ්‍රීලපාහ කායවර්ධන මධ්‍යස්ථානය



අණදෙන නිලධාරි මේජර් කේජීආර්සී කුමාර ආර්එස්පී යූඑස්පී ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය සහ මගපෙන්වීමෙන් ඒකක සෙබලුන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරන ලද මෙම කායවර්ධන මධ්‍යස්ථානය ඒකකය වෙත දායාද කිරීම 59 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් කේඑච්පීපී ප්‍රනාන්දු ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ තුමන් ගේ සුරතින් 2019 12 14 වන දිනට යෙදුනු සුභ මොහොතින් සිදුකරන ලදි

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වයට පෙනී සිටින දරුවන්ට අත්වැලක් වෙමින් 14 (සේවි) ශ්‍රීලපාහ ඒකකයෙන්

# පෙරහුරු සම්මන්ත්‍රණ මාලාවක්



**මෙම ඒකක බලප්‍රදේශයට අයත් වන වැලිඔය සම්පත්නුවර අධ්‍යාපන කොට්ඨාශය යටතේ පාලනය වන අති දුෂ්කර අධ්‍යාපන පහසුකම් ඇති පාසැල් 7කට අයත් 2019 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනි සිටීමට නියමිත දූ දරුවන් 205 දෙනෙකු වෙනුවෙන් මෙම ඒකකයේ සම්බන්ධීකරණයෙන් යුතුව 2019 ජුනි මස 29 හා 30 යන දෙදින පුරා මුලතිව්/සම්පත්නුවර ජාතික පාසැලේදී ශිෂ්‍යත්ව පෙරහුරු සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.**

මෙම ඒකක අණදෙන නිලධාරි මේජර් සී ජයවීර ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ ආදි මිතුරු කැල හා කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන්ගේ අනුග්‍රහයෙන් මෙම ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය පවත්වන ලද අතර සහභාගි වු දරුවන් හට ආහාර පාන, ත්‍යාග හා ආදර්ශ ප්‍රශ්ණපත්‍ර කට්ටල බෙදාදීම ද මෙහිදී සිදුවිය.

මෙම සම්මන්ත්‍රණය අගුණකොලපැලැස්ස අලුත්වැව ප්‍රාථමික විදුහලේ නලින්ද සිල්වා ගුරුතුමා හා තංගල්ල ප්‍රාථමික විදුහලේ චතුර මදුසංඛ යන ගුරුභවතුන් විසින් පැවැත්වු අතර ඒකක අණදෙන නිලධාරි මේජර් සී ජයවීර, වැලිඔය කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යාක්ෂක එම්පී රාමනායක මහතා හා ප්‍රදේශයේ විදුහල්පතිවරුන් හා ගුරුභවතුන්ද දෙමාපියන්ද මේ අවස්ථාවට සහභාගි විය.

දින දෙකක් පුරා පැවති මෙම සම්මන්ත්‍රණය ප්‍රදේශයේ දරුවන්ට ඉතාමත් ප්‍රයෝජනවත් වූ බව ගුරුවරුන්ගේ මතය විය. දෙමාපියන් වෙනුවෙන්ද සාකච්ඡාමය වැඩසටහනක් සංවිධානය කර තිබීම පැමිණි සියලුම දෙනාගේ පැසසුමට ලක්විය.



# 16 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයෙන් දිළිඳු පවුලකට නව නිවසක්



16 (සෙව්) ශ්‍රීලපාහ ඒකකය පේදුරුතුඩුව නගරයට ආසන්න මනල්කාඩු මුහුදු තීරයට උතුරින් තරමක් දුෂ්කරවූ ප්‍රදේශයක ස්ථානගතව සිටින අතර මෙම බලඇණියේ ශ්‍රම දායකත්වයෙන් කෙටි කාලසීමාවක් තුලදී පේදුරුතුඩුව, කට්කෝවලම් ග්‍රාමයේ පදිංචි කේ නට්කුනකුමාරි නමැති දිළිදු කාන්තාව හට නව නිවසක් ඉදිකර දෙන ලදී.

යාපනය ආරක්‍ෂක සේනා ආඥාපති තුමාගේ උදාර සංකල්පයක් වන යාපනය අර්ධද්වීපයේ දිළිදු වැසියන්ට නිවාස තනාදීම අරමුණු කරගෙන එතුමන්ගේ මගපෙන්වීම මත කුමා වීරසූරිය මහතා සහ ඔහුගේ සමීපතම හිතෛෂීන්ගේ මූල්‍ය අනුග්‍රහය ඇතිව 16 වන (සෙව්) බලඇණිය ශ්‍රීලංකා පාබල හමුදාවේ වත්මන් අණදෙන නිලධාරී වන මේජර් යුආර්එල් පෙරේරා ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඒකකයේ ශ්‍රම දායක්තවය මත 2019.05.13 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 2019.07.12 දින වැඩ නිමකරන ලදි.

ඒකක අණදෙන නිලධාරී තුමන්ගේ ආරාධනයෙන් ආරක්ෂක සේනා මූලස්ථානය. (යාපනය) ආඥාපති තුමන්ගේ ප්‍රධානත්වයෙන් හා කුමා වීරසූරිය මහතාගේ සහභාගිත්වයෙන් 2019.07.13 දින මෙම නිවස පේදුරුතුඩුව කට්කෝවලම් ගම්මානයේ පදිංචි කේ නට්කුන කුමාරි මහත්මිය වෙත ප්‍රදානය කරන ලදී.





# ශ්‍රීලපාහ රණ විරු දස්කම්

ශ්‍රී ලංකා පාබල හමුදාවේ සෙබළුන්ගේ සැඟවී ඇති කුසළතා කළඑළි බසිනා තෝතැන්න...

## කෙටි කාලීන තරුණ නිලධාරි පාඨමාලාවේ දෙවන ස්ථානය



 නි/69603 කපිතන් ඒ ආර් මධුශංක ශ්‍රීලපාහ

2019 වර්ෂයේ ඉන්දියාවේ මාහෝ හිදි පැවති කෙටි කාලීන තරුණ නිලධාරි පාඨමාලා අංක 10 සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සියලු පාබල රෙජිමේන්තු වලින් නිලධාරි සියදෙනෙකු සහභාගි විය. එහිදි පාඨමාලාවේ හොදම සහභාගිත්වය සදහා සම්මානය සහ සමස්ථ පාඨමාලාවේ දෙවන ස්ථානය ලබා ගැනීමට 23 ශ්‍රීලපාහ ඒකකයේ කපිතන් ඒආර් මධුශංක ශ්‍රීලපාහ නිලධාරි සමත් විය.



විදේශ සරඹ උපදේශක පාඨමාලාව හැදෑරූ
සෙ/319054 සැරයන් ආරියරත්න කේඑස් (ආර්එස්පී)

**මෙතෙර පාඨමාලා :**
සරඹ උපදේශක පාඨමාලාව : අංක 103 - ප්‍රථම ස්ථානය, 2013.10.23 සිට 2014.01.22 දින දක්වා සපුපා අම්පාර

**එතෙර පාඨමාලා :**
සරඹ උපදේශක පාඨමාලාව : අංක 73, ස්ථානය 24, 2019.03.31 සිට 2019.05.16 දක්වා බංගලාදේශය

## රටක් එලිය කල ශ්‍රීලපාහ විරුවෙක්



2019 අප්‍රේල් මස 15 දින සිට 2019 ජුනි මස 22 දින දක්වා ඉන්දියාවේදී නේපාලය, බූතානය, බංගලාදේශය හා ශ්‍රීලංකාව යන රටවල් එක්ව පැවති **JUNIOR COMBAT LEADRSHIP COURSE - NO 36** පාඨමාලාව සඳහා 6 ශ්‍රීලපාහ ඒකකය වෙතින් සහභාගී වූ සෙ/316842 සැරයන් ප්‍රේමරත්න පීටීජීසීඑල් ආර්එස්පී යූඑස්පී ජ්‍යෙකොනොනි පාඨමාලාවේ සෑම ඉසව්වකින්ම ප්‍රථම ස්ථානය ලබාගෙන පාඨමාලාවේ දක්‍ෂතම විදේශීය ශිෂ්‍යාට හිමි සම්මානය හිමිකරගෙන සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටම මෙන්ම ශ්‍රීලපාහ රෙජිමේන්තුවට ද කීර්තියක් එක්කරන ලදී.

## කණිෂ්ඨ නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලා අංක 31 සාර්ථකව හැදෑරීම



සටන් පුහුණු පාසල අම්පාර වෙතින් 2019.08.01 දින සිට 2019.08.22 දින දක්වා පවත්වන ලද කණිෂ්ඨ නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලා අංක 31 හදාරනු ලැබූ සිසු/සිසුවියන් 225 ක් අතුරින් පාඨමාලාවෙහි විෂයන් තුලින් උසස් ප්‍රථිපල ලබාගනිමින් 19 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/332381 සාසෙ නුවන් ආර්පී යන සෙනී පාඨමාලාවේ තුන්වන ස්ථානය හිමිකර ගන්නා ලදී.




## ශිල්ප දිනා එන සඳ මම සුරලොව් ගොස් මගේ පියා

තක්ෂලාවේ අකුරු  කරනට පා තැබූ ඒ මුල් දිනේ
පියා නාවෙ මාත් සමඟින් ඇයි ද අම්මෙ කිව මැනේ
යහළුවන් පවුපියන් සමගින් හුරතලෙන් සිටියා පෙනේ
පියා නාවට කාරි නෑ මට සෙවනැල්ල වෙයි මවු සෙනේ

රටක් පුතුහට ලබාදෙන්නට සටන් බිම වෙත ඔහු ගියා
පුතේ නුඹ අප සැවොම රකිනුව අවිය ඇත ඔහු අත දරා
අපේ සවියත් රටේ සවියත් ඔහුගෙ දෑතේ වෙයි සදා
පුතේ දිරිගෙන උගත මැන සිප් එයයි මතු දියුණුව සදා

පුතුගේ සුරතල් කිරි සිදා මුව හැමදාම සිහියෙන් බලා
මගේ පුතු මතු රජෙක් වේවයි පැතුම් සුළඟේ පා කළා
ශිල්ප ජයගෙන පුතා එන සඳ පියා දෙව්ලොව සිට බලා
තුටින් කඳුලැල් වගුරුවනු මට පෙනෙයි දෙනෙතත් බොඳ වෙලා






සෙ/ඩී100998 සාසෙ පුෂ්පරත්න
එම්ඩීඑස් 5 (සෙව්) ශ්‍රීලපාහ



## ආසේමු (මුලතිව්) නව නිපැයුම් තරගාවලියේ ප්‍රථම ස්ථානය දිනාගත් 1 ශ්‍රීලපාහ ඒකකයේ

# ස්වයංක්‍රීයව හැකිළෙන මෝටර් සයිකල් රඳවනය



ආරක්ෂක සේනා මූලස්ථානය මුලතිව් ආඥාපති මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ජ්ඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩීසී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ සංකල්පයක් මත ආරක්ෂක සේනා මූලස්ථානය මුලතිව් යටතේ පාලනය වන ඒකකයන් හි රාජකාරී කරනු ලබන සෙබලුන්ගේ නිර්මාණශීලි හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් නව නිපැයුම් සහ නව සොයා ගැනීම් ප්‍රදර්ශණයක් 2019.07.25 වන දින ආසේමු (මුලතිව්) හිදී පවත්වන ලදී. එහිදී විවිධ වූ නිර්මාණ අතරින් 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ **සෙ/319228 සැරයන් පතිරණ පීඩබ්ලිව්සී (ආර්එස්පී) ජේයකොනොනි** විසින් ඉදිරිපත් කරන ලද ස්වයංක්‍රියව හැකිලෙන මෝටර් සයිකල් රඳවනය සඳහා ප්‍රථම ස්ථානය හිමි විය. මෙම නිර්මාණය සඳහා පේටන් බලපත්‍රය ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට ඔහු හට හැකිවීම තවත් විශේෂ වූ සිදුවීමකි. මෙම නිර්මාණය තරඟාවලිය නැරඹීම සඳහා පැමිණි කාගේත් පැසසුමට ලක් වූ අතර, ඒකක අණදෙන නිලධාරී තුමන් ඇතුලු සියලුම නිලධාරීන් සහ සෙසු නිලයින් විසින් ඔහු හට සුභාසිංශනය පුද කරන ලදී. එමෙන්ම මෙම ජේ‍යකොනොනි හට තවත් වටිනා නිර්මාණ කිරීමට හැකියාව ශක්තිය ධෛර්‍ය ලැබේවායි මෙසේ ප්‍රාර්ථනා කරන්නෙමු.

## නුඹ උපන් දිනයක් සිහිවී

ආසිරි පතන්නේ...අම්මා තාත්තා
ඇතුළු පවුලේ සියලුදෙනා



2020.01.05 වන දින 8 වැනි උපන් දිනය සැමරූ 12 ශ්‍රීලපාහ ඒකකයට අයත් කෝප්‍රල් පත්මසිරි UDN ගේ හා මව නිපුනි පූර්ණිමා ගේ ආදරණීය දියණිය

**පේශිකා දෙව්න්සා**



2019.11.28 වන දින 3 වැනි උපන් දිනය සැමරූ රෙජිමුඛ ශ්‍රීලපාහ ඒකකයට අයත් ලාකෝ වික්‍රමසිංහ ADS ගේ හා මව උදයංගනී ගේ ආදරණීය දියණිය

**තෙනුදි සහන්යා**



2019 10 02 වන දින 2 වන උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ ඒකකයට අයත් සැරයන් කුමාර හේරත් RMS (RWP RSP) ගේ ආදරණීය පුතණුවන්

**ගිම්හාන් යසිරු**



2019.12.14 වන දින උපන් දිනය සැමරූ 8 ශ්‍රීලපාහ ඒකකයට අයත් සාසෙ බංඩාර PGSP ගේ හා මව උදේශිකා කුමාරි ගේ ආදරණීය දියණිය

**රිහෝෂා පංචාලි**



23 ශ්‍රීලපාහ ඒකකයට අයත් කෝප්‍රල් රත්නායක MRMSN ගේ ආදරණීය පුතණුවන් දෙදෙනා

2019.12.30 වැනි දින 10 වන උපන් දිනය සැමරූ

**විමේෂ් තීක්ෂණ**

2019.12.15 වැනි දින 6 වන උපන් දිනය සැමරූ

**ඔෂධ නවීන්**



2020.01.16 වන දින 02 වන උපන් දිනය සැමරූ 9 (සෙවි) ශ්‍රීලපාහ ඒකකයට අයත් සාසෙ විජය කුමාර KPWK ගේ හා මව දිල්රුක්ෂිකා දිසානායක ගේ ගේ ආදරණීය පුතණුවන්

**කවීෂ නෙත්සර**



# උපාසක

## කෙටි කථාව

විමලසේන මුදාගේ මහතා විසින් රචිත අන්තර්ජාලයේ "කැටපත් පවුර" වැඩසටහනේ පළවූ කෙටි කථාවකි.

ගල උඩ විහාරයේ පඩි පෙළ නගින අප්පුසිඤ්ඤෝ මුදලාලිට මුහුදෙහි සෝෂාව හොඳින් ඇසුණි.

ඉදිරියට බර ව හිස බිමට නමාගෙන පඩි පෙළේ ඉහළට ගමන් කළ ඔහු සරම කකුලට පැගේදෝ යන සැකයෙන් පඩි පෙළ නැග්ගේ සරොම් පට වමතින් ඔසවා ගෙන ය. මුදලාලි ජාතික බැනියම ද, සුදු සරම ද ඇන්දේ කාලයකට පසුව ය. ඔහුගේ මතකයේ හැටියට ලොකු දුව දීග දෙන දා ජාතික බැනියම ඇන්දාට පසු නැවත එය ඇන්දේ අද ය.

වෙහෙර මළුව හරහා වැඩම කළ ලොකු හාමුදුරුවෝ මුදලාලි වෙත මඳ සිනාවක් පෑවෝ ය.
''මුදලාලි අද සිල් ගන්න වගෙයි. බොහොම හොඳයි. බොහොම හොඳයි. පරලොවටත් යමක් කර ගන්න එපායැ. ජීවිතේ අවබෝධ වෙන කොට ඔහොම තමයි.''

තමා සිල් ගන්නට පැමිණියේ ජීවිතය අවබෝධ වීමෙන්වත්, අවබෝධ කර ගැනීමටවත් නොවන බැව් මුදලාලි දනී. ඒ නිසා ම ඔහුගේ යටි සිතට සිනහවක් නැගුණි. අද සිල් ගැනීමට සූදානම් වූයේ ලොකු දුවගේ උවමනාවට මිස තමාගේ උවමනාවට නොවන බව මුදලාලිට සිහිපත් විය. ධර්ම ශාලාවේ එක් තැනක හෝරා කීපයක් එකම ඉරියව්වෙන් වාඩි වී සිටීම ඔහුගේ හිතට රුස්සන්නක් නොවී ය.

එරමිණිය ගොතාගෙන සිටි මුදලාලිගේ දෙපා ඇඳුම් දෙන්නට විය. අනෙක් සිල් ඇත්තන් වසරකට කීප වරක් සිල් ගැනීමට පැමිණ ඇති කර ගත් හික්මීමත්, සන්සුන්කමත් අප්පුසිඤ්ඤෝ මුදලාලි තුළ තිබුණේ ම නැත. කකුල් කකියන්නටත් සෘජුව තබාගත් කොන්ද ඇඳුම් දෙන්නටත් වූ විට ඔහුගේ සිත තුළ ලොකු දූ කෙරෙහි කෝපයක් ද හට ගත්තේ ය.

දවල් දානය සඳහා තම නිවසට ම යා යුතු යැයි මුදලාලි කල්පනා කළේ ය. එසේ ගියහොත් මඳ වේලාවක් නිවී සැනහිල්ලේ දිග ඇදී ඉන්නට ද හැකි බැව් ඔහුට සිහිවිය. සෑම දිනක ම උම්බලකඩ යහමින් යෙදූ ලුණු මිරිසක් මුදලාලිගේ කෑම පිඟානට අනිවාර්යයෙන් ම එක් විය. පන්සලේ සිට ආපසු නිවසට එන මුදලාලිට උකුවට සෑදූ කිරි හොද්දේ සුවඳ සහ ලුණු මිරිසේ රසය ද දැනෙන්නට විය.
සියලුම සිල් ඇත්තන් පාර දිගේ ගොස් තම නිවෙස්වලට යන්නට ගිය නමුත්, අප්පුසිඤ්ඤෝ මුදලාලි ගාළු පාර පැන වෙරළ දිගේ නිවස බලා යන්නට ගියේ ය. වෙරළට පැමිණි ඔහුට සුව පහසුවක් සහ නිදහසක් දැනුණි.
ලුණු රස මුසු වුණු සුළඟ ඔහුගේ සිතට ගෙන දුන්නේ ප්‍රබෝධයකි.
කැරැව පසු කළ මුදලාලිට රේගුවේ පැරණි ගොඩනැගිල්ලත් ඒ සමඟ ම මුහුදට විහිදෙන මැද්දේ ගලත් හොඳින් පෙනුණි. ඇහි බැම් වලට ඉහළින් නළල මත වම් අත තැබූ ඔහු මැද්දේ ගල දෙස බැලුවේ ය.
අවුරුදු විස්සකට තිහකට පෙර මැද්දේ ගලට ළං ළං ව වරායේ නවතා තිබූ රුවල් නැව් මුදලාලිගේ හිතට නැගුණි. ඉන්දියාවේ සිට ඒවායින් ගෙනා ජාඩි පීප්ප සහ රට උළු ගබඩා කොට තැබුවේ පැරණි රේගු ගොඩනැගිල්ලේ ය. දැන් ඒ දිනවල මෙන් කටට රහට ජාඩි ටිකක් කන්නට කොයින්දැ යි මුදලාලි කල්පනා කළේ ය.
ඔහු ගමන් කළේ පන්සලේ දී අත් දණ්ඩේ දමාගෙන තිබූ පත්කඩයත්, උතුරු සළුවත් දෙක ම කරේ දමාගෙන ය. කැරැව පසු කළ මුදලාලි කටේ තිබූ බුලත් හපය වම් අල්ලට ගෙන මුහුදට විසි කළේ ය. ඉන් පසු සරම මඳක් අත් කරගෙන පහතට නැමී අතට ගත් මුහුදු වතුරෙන් කට සේදුවේ ය. මුහුදු වතුරෙන් කට සේදූ ඔහුට ප්‍රණීත බවක් දැනුණි. ලුණු ගතිය පහ වෙන්නට කාරා කෙළ ගැසූ මුදලාලි වෙරළෙන් ගොඩ වී ගමන් කළේ නිවස දෙසට ය.

''අපි හිතා හිටියෙ උපාසක ඇත්තොත් එක්ක පාරෙන්
ම ඒවි කියල.''මුදලාලිගේ බිරිඳ නෝනබබා කුස්සිය
පැත්තෙන් එබිකම් කොට පැවසුවා ය.
''ඉස්සරහ පැත්තෙන්ම ආවනං තාත්තේ.''
එසේ කීවේ ලොකු දුව සැලී ය.
සැලී දීග දුන්නේ ගන්දර මාළු මුදලාලි කෙනෙකුට ය. ඔහු
කලේ මාළු අයිස් දමා පිට පළාත් වලට රේල්ලුවෙන් සහ
ලොරිවලින් යැවීම ය. කලක සිට සැලීගේ නැන්දම්මාත්
මාමණ්ඩීත් සැම පෝයකට ම සිල් ගැනීම සිරිතක්
කරගෙන තිබුණි. අප්පුසිඤ්ඤෝ මුදලාලිත්, නෝනබබාත්
සිල් නොගැනීම පිළිබඳ ව ගන්දර ගෙදර දී සාකච්ඡාවට
භාජනය විය. එය සැලීට තරමක මදිකමක් වී තිබුණි. ඒ
නිසා ම පෝයට දින දෙකකට කලින් කුමාරකන්දේ මහ
ගෙදරට පැමිණි සැලී තාත්තාත් අම්මාත් සිල් සමාදන්
වීමට යැවීම සඳහා කටයුතු සම්පාදනය කළා ය.
සතියකට කලින් සිල්වා දොස්තර මහතාගෙන කැර-
කිල්ලට බෙහෙත් ගැනීමට සැලීගේ මව ගිය විට දොස්තර
මහතා ඇයට උපදෙස් දී තිබුණේ වෙහෙස මහන්සි නොවී
විවේකීව කාලය ගතකරන ලෙස ය. එබැවින් මව සිල්
සමාදන් වීමට යැවීමේ අදහස තාවකාලිකව නතර වුණි.
තාත්තා සිල් ගැනීමට අකමැත්ත පළ කළ ද සැලීගේ
බලවත් ඉල්ලීම නිසා අකමැත්තෙන් වුව ද ඊට එකඟ වීමට
ඔහුට සිදු විය. මේ පිළිබඳ ව පන්සලේ ලොකු හාමුදුරුවන්
සැලීට මුව නොසැහෙන සේ ප්‍රශංසා කොට තිබුණි.
දවල් දානය ගත් අප්පුසිඤ්ඤෝ මුදලාලි බිම එළූ පැදුරක්
මත දිග ඇදී සිටියේ ය. කාමරය තුළ වූ අධික රස්නය
නිසා වෙරළ දිහාවට යා යුතු යයි මුදලාලිට සිතුණි.
හාන්සි වී සිටීමෙන් ලිහුණු කුඩා කොණ්ඩ ගැටයේ
කෙස් පිළිවෙලකට සැකසූ ඔහු නැවතත් කොණ්ඩ ගැටය
බැඳගත්තේ ය. උතුරු සළුව සකසා ගත්තේ ය. පත්කඩය
වමතෙහි දමා ගත්තේ ය. නෝනබබා කොටා දුන් බුලත්
විට කටට හලා ගත් මුදලාලි ටික වේලාවකින් ආපසු එන
අදහස ඇතිව වෙරළ දෙසට ගමන් කරන්නට විය.
ඇගේ දහඩිය ගතිය වෙරළට ගිය සැනින් වියැළුණි. ඔහු
කැරුවේ බැලුම්ගලට ඉහළින් මුහුද දෙස බැලුවේ ය. මධ්‍ය
හ්නය හෙයින් ඒ දෙස බැලූ ඔහුගේ දෑස් නිලංකාර විය.
දිය කඳට වැටී සලිත වන සැඩ හිරු රැස් වලින් දෙඇසට
ගෙන දුන්නේ පීඩාවකි. දෙබැමට ඉහළින් නළල මත අත
තබා විපරමින් මුහුද දෙස බැලුවේ එහෙයිනි.


අප්පුසිඤ්ඤෝ මුදලාලිට තමා සිල් ගත් බැව්
මොහොතකට අමතක විය. සියල්ල අමතක වූ ඔහු දැන්
සිටින්නේ කැරුවේ බැලුම්ගල මත ය. අද සිල් නොගත්තේ
නම් කොතරම් අපූරුදැයි ඔහුට සිතුණි. හොඳ විමසිල්ලෙන්
බැලූ මුදලාලිට මැද්දේගලටත්, බැලුම්ගලටත් අතර දියඹට
වන්නට විශාල පදාසයක් වසාගත් තද නිල් පැහැයක්
පෙනුණි.
නිසැකව ම ඒ මාලු අයිනක් බව මුදලාලි දනී. නමුත් මේ
සිල් රෙද්දක් පටලවාගෙන කටක් ඇර වෙන කෙනෙකුට
මෙය දැනුම් දෙන්නේ කෙසේදැ යි මුදලාලි ලතැවුණේ
ය. බිමට හැරුණු හිසින් යුතුව බැලුම්ගලින් බිමට බට ඔහු
වෙරළට ගොඩ වුණේ කලකිරීමකට ළං වුණු හැඟීමෙන්
යුතුව ය.
''වාරකන් කාලෙට කරන්න දෙයක් නැතුව ලතැවෙනව. ඒ
කාලෙට සිල් ගන්න කියන්න ආව නම් මක් වෙනව ද?''

ලොකු දුව සැලී පිළිබඳ නොරිස්සුම් ස්වභාවයක්
අප්පුසිඤ්ඤෝ මුදලාලිගේ හිතේ නලියන්නට විය. තව
මොහොතකින් මාළු අයින වෙන දිහාවකට යන්නට බැරි
නැත. වෙරළේ පේන තෙක් මානයක කිසිවෙකු ද නොවී
ය.

මුදලාලි උතුරු සළුව වැටකෙයියා ගසක රුඳෙව්වේ ය.
කිසිවක් නොදන්නාක් මෙන් නිවසට ගොඩ වැදී පන්සලට
යාමට සූදානම් වුණි. මද්දුම පුතාට කතා කළ හේ
වැටකෙයියාවේ දමා ආ උතුරු සළුව ගෙන එන්නට කීවේ
ය.

පුතා ගොස් මඳ වේලාවකින් වෙරළ දෙසින් හූ හඬ නැගෙ
න්නට විය. උතුරු සළුව රැගෙන ඒමට ගිය මද්දුම පුතා හූ
හඬ තැබුවේ අනෙක් හවුල්කාරයින් ද වෙරළට කැඳවීමේ
අදහසිනි. උතුරු සළුව කොලුවකු අතේ තාත්තාට යැවූ
මද්දුම පුතා මාදැල් ඔරුවේ නැගී දැල වටකරන්නට ගියේ
ය. මුදලාලි ආපසු පන්සලට ගියේ ගාලු පාර දිගේ ය.
''හුරුල්ලෝ විසි තිස් දාහක් මාළු ඉන්න ඇති. මද්දුමය
දස්සය. සේරම ටික කොටු කර ගනීවි.''
ගල් පඩි නැග වෙහෙර මලුවට පිවිසෙත් ම මුදලාලිගේ
සිතේ සියුම් සතුටක් මෝදු වෙමින් තිබුණි.

-සමාප්තයි-





# වතුර බොන්න එපා

**සිරුරට අත්‍යවශ්‍ය දෙයක් තමයි ජලය කියන්නේ. රෝගාබාධ රැසකට සුවය ලබා දෙන්න මේ පානයට පුළුවන්. නමුත් ජලය බිම සුදුසු නැති වෙලාවල් කීපයකුත් තියෙනවා. නුසුදුසු වෙලාවල් වල ජලය පානය කිරීමෙන් ඔබට අතුරු ආබාධ ඇති විය හැකියි.**

## නිදා ගන්න යන්න කලින් වතුර බොන්න එපා

නිදා ගැනීමට පෙර ජලය පානය කිරීමෙන් වැළකී සිටීමට හේතු දෙකක් තියෙනවා.

01. නින්දට පෙර ජලය පානය කිරීමෙන් ඔබේ නින්දට බාධා ඇති විය හැකියි. රාත්‍රියේදී ඔබට මුත්‍රා කිරීමට අවශ්‍ය වන අතර, ඒ හේතුවෙන් නින්ද අතරතුරදී නැවත අවදි වීමට ඔබට සිදු වෙනවා. එමෙන්ම නැවතත් ඔබ වෙත නින්ද ලඟා වීමට වැඩි කාලයක් ගත වනු ඇත.

02. වකුගඩු වල ක්‍රියාකාරිත්වය දිවා කාලයට සාපේක්ෂව රාත්‍රී කාලයේ දී අඩු වේ. උදෑසන මුහුණේ සහ ඇඟිලි ස්වල්ප වශයෙන් ඉදිමෙන්නේ මේ නිසායි. නින්දට පෙර ජලය පානය කිරීමෙන් මෙම ලක්ෂණ ඇති වීම වැඩි වේ.

## මහන්සි වෙන අතරතුර වතුර බොන්න එපා

සමහරු පුරුදු වෙලා ඉන්නවා ව්‍යායාම කරන අතරතුර, මහන්සි ඇති වෙන රාජකාරියක නිරත වෙලා සිටින අතරතුර ජලය පානය කරන්න. එය නුසුදුසු ක්‍රියාවක්. වෛද්‍ය විද්‍යාත්මක සොයා ගැනීම වලට අනුව මහන්සි වන අතරතුර ජලය පානය කිරීමෙන් සෘණාත්මක ප්‍රතිඵල ඇති වෙනවා. මහන්සි වීමේදී පුද්ගලයෙකුගේ ශරීරයේ උෂ්ණත්වය අධික ලෙස වැඩි වීමට හේතු වේ. එවැනි අවස්ථාවකදී ජලය පානය කිරීම නුසුදුසුය. මෙහි ප්‍රතිඵලයක් ලෙස හිසරදය, වමනය ඇති වීම සහ කරකැවිල්ල ඇති වීම සිදු විය හැක. එමෙන්ම හදවත් රෝගීන් මහන්සි වන අතරතුර ජලය පානය කිරීමෙන් හදිසි හෘදයාබාධ වලට පවා ලක් විය හැකියි.

## මුත්‍රා වල පැහැය විනිවිද පෙනෙන සුළු බවින් යුක්ත නම් වතුර බොන්න එපා

සම්පූර්ණයෙන්ම පැහැදිලි මුත්‍රා වලින් හෙළි කෙරෙන්නේ ඔබේ සිරුර පමණට වඩා සජලනය වී ඇති බවකි. ඔබේ මුත්‍රා අවර්ණ නම්, එයින් හැඟවෙන්නේ දිනය තුල ඔබ පානය කල යුතු ජල ප්‍රමාණයට වඩා ඔබ ජලය ලබා ගෙන ඇති බවයි. පමණට වඩා ජලය පානය කිරීමෙන් ඔබේ සිරුරේ අඩංගු සෝඩියම් මට්ටම පහල බැසීම, හෘදයාබාධ ඇති වීම, hyponatremi රෝගය වැළඳීම, කරකැවිල්ල, මානසික ව්‍යාකූලතා සහ මානසික අවපීඩනය වැනි බැරෑරුම් සෞඛ්‍යය ගැටලු හට ගැනීමට හේතු විය හැක.

## මිරිස් ආහාර ගැනීමෙන් ඇති වන දැවිල්ල නැති කිරීමට වතුර බොන්න එපා

අධික මිරිස් සහිත ආහාරයක් ලබාගත් විට උගුරේ සහ බඩේ දැවිල්ලක් ඇති වීම සාමාන්‍යයි. එවැනි අවස්ථාවකදී

බොහෝ දෙනෙක් කරන්නේ ජලය පානය කිරීමයි. නමුත් එමඟින් ඇති වී තිබෙන දැවිල්ල සහගත ස්වභාවය ඉහල යා හැකියි. එවැනි අවස්ථාවකදී දැවිල්ල අඩු කිරීමට සුදුසුම පානය වන්නේ කිරි පානයකුයි. එයට හේතුව වන්නේ කිරි නිර්ධ්‍රැවීය පානයක් වීමයි.

### ආහාර ගන්නා අතරතුරේදී වතුර බොන්න එපා

ඔබ ආහාර ලබා ගන්නා අතරතුරේදී වතුර පානය කරනවා නම්, ඔබට අජීර්ණයත් වැළඳීමේ අවදානමක් පවතිනවා. ආහාර ගන්නා අතරතුරේදී ඔබේ මුඛයෙන් ආහාර දිරවීමට උපකාර කරන එන්සයිමයන් නිපදවනු ලබනවා. නමුත් ආහාර ගන්නා අතරතුරේදී ජලය පානය කරනවා නම්, මේ එන්සයිමයේ ක්‍රියාකාරිත්වය අඩු වෙනවා. ඔබ ආහාර ගන්නා අතරතුරේ අයිස් ජලය, ඇල්කොහොල් මුසු පානයන් ලබා ගන්නවා නම් මේ තත්වය තවත් නරක අතට හැරෙනවා.

### මුහුදු ජලය පානය කිරීමෙන් වලකින්න

මුහුදේ රැල්ල පැගීමට හෝ පිහිනීමට ගිය විට වැරදීමකින් හෝ මුහුදු වතුර පානය කරන්න එපා. එමඟින් ඔබට වයිරස් සහ බැක්ටීරියා අසාදනය වී විවිධ රෝගාබාධ වලට ගොදුරු වන්නට සිදු වේවි. එමෙන්ම මුහුදු වතුරේ අඩංගු ලුණු නිසා ඔබේ සිරුර විජලනයට පත් විය හැකියි. මේ නිසා ඔබ මුහුදු රැල්ල පැගීමට හෝ පිහිනීමට යනවා නම් පිරිසිඳු වතුර බෝතලයක් රැගෙන යන්නට කල්පනාකාරී වන්න.

# තරහ අමතක කර, සමාව දීම වැදගත් වන්නේ ඇයි?



**ඇතැම් අය තමන්ට වරදක් කළ අයෙකුට ලේසියෙන් සමාව දෙන්නේ නැහැ. කරපු වරද හිතේ තියාගෙන, අනිත් කෙනාට වෛර කරමින් ජීවත්වීම ඔබ හිතන තරම් හොඳ නැහැ. තවත් සමහරු ඉන්නවා, සමාව දුන් බව පවසමින් වරද මතක තබාගෙන ඉන්න. ඒත් නිවැරදි සමාව දීමකින් සිදු කෙරන්නේ, සිදු වූ වරද සම්පූර්ණයෙන්ම අමතක කර දැමීමයි. සිතේ පැසවෙමින් තිබෙන වෛරය ඔබේ මනස සහ ශරීරය රෝගී කරවන බව ඔබ දන්නවාද? අනුන් තමාට කළ වැරදි දිගින් දිගටම සිතේ තබාගෙන සිටීමෙන් අහිතකර ප්‍රතිඵල රැසක් ඔබට අත් වෙනවා.**

### ඔබේ සිත තුල අප්‍රසන්නශීලී හැඟීම් දළුලනවා

ඔබ කුමන කටයුත්තක් කිරීමට උත්සාහ කළත් ඔබේ සිත තුල තිබෙන්නේ තරහවක්. ඔබට වැරදි කළ පුද්ගලයා හා ඔහු සම්බන්ධ ඕනෑම දෙයක් ඔබේ ඇස ගැටුණු සැනින් ඔබට සිහි වන්නේ ඒ පැරණි සිදුවීමයි. ඔබේ සිත තුල නිරන්තරයෙන් කෝප සහගත හැඟීම් ඇති වෙද්දී, ඔබ නොසන්සුන් වෙනවා. ඔබේ සමීපයෙන් සිටින අනෙක් අයවත් ඔබට රුස්සන්නේ නැහැ. කවුරුන් හෝ අනෙකාගේ හොඳක් කිවත් ඔබට ඇති වන්නේ නොරිස්සුමක්. ඔබේ සිත තුල ඉතිරි වන්නේ වේදනාවක් පමණයි.

### ඔබේ නිදහස අහිමි වී යනවා

නිදහසේ ඉන්න වෙලාවල් වල අපිට ජීවිතය ගැන, පරිසරය ගැන සහ අපේ ආදරණීයයන් ගැන විවිධ සිතුවිලි හට ගන්නවා. නමුත් වෛරයෙන් සිටින අයෙකුගේ සිතට නිදහස් වේලාවන් වල පැමිණෙන්නේ වෛරී සිතුවිලියි. පෙර ඇති වූ වේදනාකාරී සිදුවීම සිහි කරමින් ඔවුන් නිරන්තරයෙන්ම කල් ගෙවනවා. විනෝද වීමට, නිදහසේ පොතක් කියවීමට හෝ රූපවාහිනිය නැරඹීමට ඔවුන්ට අපහසුයි. ඒ සෑම වෙලාවකදීම වේදනාත්මක සිතුවිලි ඔවුන්ට බාධා ඇති කරවනවා.

### වර්තමානයේ ජීවත් වීමේ අවස්ථාව අහිමි වීම

පැරණි සිදුවීම් හිතේ තියාගෙන ඉන්න තරමට ඔබට ජීවත් වීමට සිදු වන්නේ අතීතයේයි. අතීතයේ වේදනාත්මක සිදුවීම් ගැන සිතමින් සිටිනා තරමට, ඔබට වර්තමානයේ ජීවත් වීමට ඇති අවස්ථාව අහිමි වී යනවා. අතීතයේ වේදනාවන් නිසා බොහෝ අයට වර්තමානයේ ඇති සතුට අත් විඳීමට නොහැකි වෙනවා. ඔබ වටා ප්‍රීති වීමේ කාරණා දහසක් තිබුණත්, සිතේ ඇති තරහව නිසා ඔබට ඒවා නොපෙනී යනවා.

### ඔබේ හිතවතුන් ඔබට අහිමි වී යාම

මෙසේ වීමට හේතු වන්නේ ඔබ ඔවුන්ගෙන් වෙන වැරදි වලට සමාව නොදී, පලි ගැනීමට සහ වෛර කිරීමට පෙළඹීමයි. සිතේ තරහව රඳවාගෙන සිටීමේදී ඔබ ඔබේ බැල්මෙන් හා වචන වලින් පවා ඔබටත් නොදැනීම ඔබ ඔවුන්ව රිදවනවා. ඉතින් එකිනෙකා ඔබෙන් දුරස්ව යන්නේ ඔබටත් නොදැනීමයි. මීට අමතරව ඔබ වෙනත් කෙනෙකු සමඟ අමනාපයෙන් සිටියදී වුවත්, ඔබ පසු වන්නේ නොරිස්සුම්සහගත විලාශයකින්. ඔබ වැඩිදුර නොසිතුවත්, ඔබ වටා සිටින අයට මෙය දැනෙනවා. සිතේ ඇති නොරිස්සුමේ ප්‍රතිඵලයක් ලෙස ඔබට වරදක් නොකළ අය සමඟ පවා නිතරම තරහා ඇති වෙනවා. ඉතින් ඔබ වටා සිටිනා හිතවතුන් ඔබෙන් ක්‍රම ක්‍රමයෙන් ඈත් වෙනවා.

### රෝගී වීම

සිතේ පවතින දිගු කාලීන තරහවේ ප්‍රතිඵලයක් ලෙස ඔබේ මනස සහ ශරීරය රෝගී වෙනවා. ඔබේ ආහාර රුචිය අහිමි වෙනවා. මානසික ආතතිය වැඩි වෙනවා. වෛරයෙන් පසු වන පුද්ගලයාගේ සිරුරේ සීනි මට්ටම ඉහල යාමටත්, රුධිර නාල වල බැදෙන මේද ප්‍රමාණය වැඩි වීමත්, හදවත් රෝග වැළඳීමටත්, අධි රුධිර පීඩනය වැළඳීමටත්, සිරුරේ හෝමෝන වෙනස් වීමටත් වැඩි අවදානමක් පවතිනවා.

ඉතින් මේ විදිහේ ගැටළු ඇති නොවීමට නම්, ඔබ ඔබට වැරදි කළ අයට සමාව දී ඒවා අමතක කළ යුතුයි.



# WHY IS READING IMPORTANT

By : MAJOR
MSK PALLEWATHTHEGEDARA SLLI
BM - 613 BDE

**Books are wonderful things that can be both entertaining and advantageous to your health. They are almost like tools to a healthy life style. Reading is important for a variety of reasons. Persons who don't identify read can't understand the love for reading. Books can hold and keep all kind of information, stories thoughts and feeling unlike anything else in the world.**

### IMPROVES YOUR MIND

Reading is great enjoyable for many people. But it is also having many advantageous for your mental health in the form of thinking and understanding. By concentrating on the words and the storyline, it inspires your brain. This particular stimulus can sharpen your mind.

### VOCABULARY EXPANSION

When reading, you might meet a few words you don't clearly understand or even recognize. This misunderstanding can lead you to look up the word and determine the definition.

### STRENGTH YOUR WRITING ABILITIES

Persons who write, know the importance of reading. There are several ways in which it can help strengthen your writing skills, and each of these ways happens without you even realizing it.

### LOWER LEVELS OF STRESS AND TENSION RELIEF

Most people know from experience that reading is a great form of entertainment, but what you and those other people might not realize is that reading can help lower stress level. when you start reading, you will start to focus, not on your stress, but on the words and story line. In time, reading will lower your stress level, making you feel better mentally and physically.

### REDUCTION YOUR DEPRESSION

Reading, especially self-help books, can help ward off depressive occurrences. just like with lowering your stress level, reading inspires the part of the brain that deals with depression as well.

### IMPROVE YOUR MEMORY AND ATTENTION

Reading at least a little each day can improve your focus and your memory function. In this occurrence as well, reading inspires the brain that help with memory and attention.

### IMPROVEMENT YOUR SLEEP

Reading, since it allows you to relax and de-stress, it can help to you into a deep and peaceful sleep. The relaxation that books can carry is fair one of the pleasing benefits of reading every night before bed.

### ENHANCE YOUR IMAGINATION

Though the entertaining of your imagination is not one of the more common benefits, reading can expressively increase your imagination.

### READING CAN ENHANCE YOUR DAY

Sometimes, the days can be stressful and worry some, but when you lay down at night and curl up with a good book, it lifts your feelings along with that stress and worry. Daily take a few minutes for yourself and just read.

# මාසික පාලන පරීක්ෂාව - 2019

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් රෙජිමේන්තුවට අයත් බළඇණිවල පරිසාධන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් මාසිකව පවත්වනු ලබන පාලන පරීක්ෂාවේ දී ඉහළ ළකුණු ලබාගනිමින් හොඳම ශ්‍රීලපාහ බළඇණිය බවට පත්වූ ඒකක

## ජූලි සිට සැප්තැම්බර් මස දක්වා

| මාසය | ස්ථානය | ඒකකය | ප්‍රතිශතය |
|---|---|---|---|
| ජූලි July | ප්‍රථම ස්ථානය | 11 ශ්‍රීලපාහ | 100% |
| | දෙවන ස්ථානය | 8 ශ්‍රීලපාහ | 85% |
| | තෙවන ස්ථානය | 23 ශ්‍රීලපාහ | 82% |
| අගෝස්තු August | ප්‍රථම ස්ථානය | 7 ශ්‍රීලපාහ | 92.85% |
| | දෙවන ස්ථානය | 1 ශ්‍රීලපාහ | 85.81% |
| | තෙවන ස්ථානය | 8 ශ්‍රීලපාහ | 85.71% |
| සැප්තැම්බර් September | ප්‍රථම ස්ථානය | 7 ශ්‍රීලපාහ | 100% |
| | දෙවන ස්ථානය | 20 ශ්‍රීලපාහ | 96.42% |
| | තෙවන ස්ථානය | 11 ශ්‍රීලපාහ | 92.85% |



රෙම ශ්‍රීලපාහ ප්‍රධාන ලිපිකරු බනි I ආර්එම්සීජී සමරදිවාකර විසිනි.



### ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය

■ 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුනි.

### චිත්‍ර ශිල්පී

■ එස්.එම් සෙනවිරත්න රාජ්‍ය ලාංඡනය නිර්මාණය කළේය.

### වර්ණයෙදීම පිළිබඳ උපදෙස්

■ මාපලගම විපුලසාර හිමි

මූලාශ්‍ර: අධ්‍යාපන අමාත්‍යංශය

■ 1972 මැයි 22 වෙනි දින ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීම සමරනු වස් රාජ්‍ය ලාංඡනය නිර්මාණය විය.

■ රාජ්‍ය ලාංඡනය සැකසීමේ කමිටුවේ සාමාජිකයන්: නිශ්ශංක විජයරත්න, ආචාර්ය නන්දදේව විජේසේකර, ආචාර්ය සෙනරත් පරණවිතාන, එච්.ආර්.ප්‍රේමරත්න, රෝලන්ඩ් සිල්වා, ආචාර්ය මැකී රත්වත්තේ සහ මහගම සේකර

■ එවකට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මෙන්ම රාජ්‍ය ලාංඡනය හා ශ්‍රී ලංකා ජාතික ධජය නිර්මාණ කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කළ ආචාර්ය නිශ්ශංක විජයරත්නගේ මග පෙන්වීම හා උපදෙස් මත චිත්‍ර ශිල්පී එස්.එම් සේනාරත්න විසින් රාජ්‍ය ලාංඡනය නිර්මාණය කරනු ලැබීය. රාජ්‍ය ලාංඡනයේ වර්ණ යෙදීම සඳහා මාපලගම විපුලසාර හිමියන්ගේ ද උපදෙස් ලැබිණි. රාජ්‍ය ලාංඡනයේ හිමිකාරීත්වය සහ භාවිත කිරීමේ අයිතිය හිමිවන්නේ ජනාධිපතිවරයාටය.

■ **ඉර සහ හඳ:** වීර ජීවනය, සමෘධිමත් සහ ස්වයං පෝෂිත රටක්, ඉරහඳ පවතිනතාක් ධර්මයේ සහ ජාතීන්ගේ ආරක්ෂාව

■ **සමන් වැල:** නිර්මලත්වය

■ **වී කරල් සහ පුන්කලස:** සශ්‍රීකත්වය හා සෞභාග්‍ය

■ **ධර්ම චක්‍රය:** බහුතරයේ ආගම වූ බුද්ධාගමත් ධර්මිකභාවය, සාධාරණත්වය සහ හික්මීම

■ **මායිම් රේඛාව:** ඒකීය රාජ්‍යයක් යටතේ පවතින බව (මූලාශ්‍ර: අධ්‍යාපන අමාත්‍යංශය)































"සිනාවෙන්න
එකතුවෙන්න"

වයිට් හැකල් සගරාව
ප්‍රකාශන අංශය
රෙජිමේන්තු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා පාබල හමුදාව
පනාගොඩ - හෝමාගම




# සිනාවෙන්න එකතුවෙන්න

සහෝදර පාඨකයිනි... ඔබ විසින් නිර්මාණය කරන ලද හෝ ඔබ ලග ඇති හාස්‍ය රසය සහිත නිර්මානාත්මක විශේෂාංග අප් අය සමගින් බෙදාගන්න අප වෙත එවන්න
editor.whitehackle@gmail.com

# පොල් වතුර විසිකරන්න එපා



**පොල් කියන්නේ දෛනිකව නිවසේ ආහාර වේල් පිළියෙල කිරීමේදී භාවිතාවන දෙයක්. පොල් ගෙඩිය බිඳීමේදී වැඩිදෙනෙක් පොල් වතුර වීසි කර දමනවා. නමුත් එම පොල් වතුරවල අඩංගු ඖෂධීය වටිනාකම ඔබ දන්නවානම් නැවත ඒ වරද කරන එකක්නම් නෑ. මෙම ලිපියෙන් කියවෙන්නේ පොල් වතුරවල අඩංගු ඖෂධීය ගුණයන් පිළිබඳවයි.**

- පොල් වතුර රුධිරයේ අධික සීනි මට්ටම පාලනය කරයි.
- පොල් වතුර වකුගඩු වල ගල් ඇති වීමේ රෝගය සඳහා සුවය ගෙන දෙනවා.
- පොල් වතුර මඟින් හිසකෙස් පෝෂණය කරනවා.
- පොල් වතුර ආහාර ජීර්ණය සඳහා තියෙන හොඳම පිළියමක් වෙනවා.
- පොල් වතුර ඉතා ඉහල ශක්තිජනක පානයක්.
- පොල් වතුර මුත්‍රා ආසාදන වලට හොඳ ප්‍රතිකාරයක්. දිනකට පොල් වතුර වීදුරු දෙකක් පානය කිරීමෙන් සම්පූර්ණයෙන්ම මුත්‍රා ආසාදන සුව කිරීමේ හැකියාව තියෙනවා.
- පොල් වතුරේ **Lauric** අම්ලය අඩංගු වන අතර එමගින් ආහාර වල ඇති සියලුම ප්‍රෝටීන් ආරක්ෂා කරයි.
- පොල් වතුර පානය මඟින් සම ගැඹුරට ගොස් පෝෂණය කරන අතර සම වියළි ස්වභාවය අවම කරවනවා.
- රාත්‍රී නින්දට පෙර පොල් වතුර ස්වල්පයක් ගෙන මුහුණේ ඇති ලප කැළැල් වල අලේප කර උදෑසන සෝදා ඉවත් කරන්න. පොල් වතුර පානය වියළි ස්වභාවයෙන් යුතු හිසකෙස් වලට හොඳ ඖෂධයක්. පොල් වතුර පානය මඟින් රුධිර සංසරණ ක්‍රියාවලිය නිසි පරිදි පවත්වාගෙන යන්න පුළුවන්. ශරීරයට අවශ්‍ය මැග්නීසියම්, යකඩ, කැල්සියම්, සින්ක් හා මැන්ගනීස් ඇතුළු පෝෂණ කොටස් රාශියක් පොල් වතුර වල අඩංගුයි. ඒ වගේම කැලරි සහ විටමින් බී වලිනුත් එය පොහොසත්. මස්පිඩු ශක්තිමත් කිරීමටත් අස්ථි වල සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහාත් පොල් වතුර උපකාර කරයි. සිරුරේ ප්‍රතිශක්තිය වැඩි කරනවා.

## Top Focus

| | |
|---|---|
| Camera | NIKON D7200 |
| ISO | 400 |
| Focal Length | 140mm |
| Aperture | F/7.1 |
| Sutt Speed | 1/80 sec |
| Location | Diyatalawa |
| Programme | Manual |
| W/Bal | Auto |

Pix by :
Cpl Pathamasiri UDN
White Hackle Media Section



ආරක්ෂක අමාත්‍යංශයේ නව ආරක්ෂක ලේකම්

ජෙනරාල් එස්එච්එස් කෝට්ටේගොඩ (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී

තුමන්ගේ ප්‍රධානත්වයෙන් 2019.07.07 වන දින රෙම ශ්‍රීලපාහ නිලධාරී නිවස්නයේ දී පවත්වනු ලැබූ

# විශ්‍රාමික හා සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සුහද හමුවේ සමූහ ඡායාරූපය

